පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ අංකය: 79

ආයතනයේ නම: ආරක්ෂක අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்றத்தின் வெளியீட்டுத் தொடர் இலக்கம் 79

நிறுவனத்தின் பெயர்: பாதுகாப்பு அமைச்சு

பாராளுமன்றத்தின் அரச கணக்கு குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்பட்டு நடவடிக்கைகளும் பாராளுமன்றத்தில் சமர்ப்பித்தல்.

Parliamentary Series No: 79

Name of the Institution: Ministry of Defence

Submission of Observations of Hon. Minister and Steps Taken with Regard to the Reports Tabled by the Committee on Public Accounts in Terms of Standing Order No:119(4)

පටුන/பக்கம்/Contents

භාෂාව/மொழி/Language	පිටු අංකය/பக்க இலக்கம்/ Page Number
සිංහල/**சிங்களம்**/Sinhala	01-51
දෙමළ/**தமிழ்**/Tamil	52-104
ඉංග්‍රීසි/**ஆங்கிலம்**/English	105-150

පටුන

අනු අංකය	ආයතනයේ / දෙපාර්තමේන්තුවේ නම	ආයතන / දෙපාර්තමේන්තු වලට අදාළ නිරීක්ෂණ හා ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග ඇතුලත් පිටු අංකය
1	ආරක්ෂක අමාත්‍යාංශය	1-20
2	ශ්‍රී ලංකා යුද්ධ හමුදාව	21-28
3	ශ්‍රී ලංකා නාවික හමුදාව	29-33
4	ශ්‍රී ලංකා ගුවන් හමුදාව	34-38
5	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව	39-42
6	ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව	43-48
7	කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව	49-51

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 79 මඟින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආරක්ෂක අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම මුදල් වර්ෂය - 2022.

1. ආරක්ෂක අමාත්‍යාංශය

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු / කමිටුව විසින් ලබාදෙන ලද මාර්ගෝපදේශ	අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ආයතනය ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
පළමු කොටස	
1. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	විගණන විමසුම් සඳහා මෙම අමාත්‍යාංශයට අයත් එක් එක් ආයතන/අංශ හා වෙනත් දෙපාර්තමේන්තු වෙතින් පිළිතුරු ගෙන්වා ගැනීමට සිදු වීමත් එම සියලු කරුණු පිළිබඳව අවධානය යොමුකර අමාත්‍යාංශයක් වශයෙන් පිළිතුරු ලබා දීමට අවශ්‍ය වීමත් මත එවැනි විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ලබාදීම ප්‍රායෝගිකව අපහසු වී ඇත. එහෙත් අපේක්ෂිත කාල සීමාවන් තුල පිළිතුරු ලබා දීමට නොහැකි වූ විට ජාතික විගණන කාර්යාලය වෙතින් විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දිය යුතු කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කරනු ලබයි. 2023/2024 වර්ෂය වන විට 2022 වර්ෂයට සාපේක්ෂව විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කරන ලද ප්‍රතිශතය 25% සිට 80% දක්වා වැඩි වී ඇති අතර, මෙම තත්ත්වය තව දුරටත් වර්ධනය කර ගැනීම සඳහා සහ මෙවැනි නිරීක්ෂණ නැවත ඇති නොවන අයුරින් කටයුතු කරන ලෙස අමාත්‍යාංශයට අයත් සියලුම අංශ සහ ඒ යටතේ ඇති නිලධාරීන් හා කාර්යය මණ්ඩලය දැනුවත් කර ඇත.
2. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	
3. සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	2022 වර්ෂය තුල රට තුල පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් එම වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් හා 2023 වර්ෂයේදී කළමනාකරණ හා කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇත.
4. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා	2022 සමීක්ෂණ මණ්ඩලය මඟින් නිර්දේශිත අතිරික්ත සහ ඌනතා සම්බන්ධව ප්‍රායෝගිකව පවතින ගැටලු සහගත තත්ත්වයන් හමුවේ

පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	පෙන්වා දී ඇති කාල වකවානු තුල ක්‍රියාත්මක වීම ප්‍රමාද වී ඇත. නමුත් මේ වන විට 2022 වර්ෂය ඇතුලෙදි එම කටයුතු නිමකර සියලුම වාර්තාවන් විගණකාධිපති වෙත යොමුකර ඇත.
5. වාහනයක් ගර්හිත වී මාස 8 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	2022 වර්ෂයට අදාළව මෙම අමාත්‍යාංශයේ වාහන අපහරණයක් සිදුකර නොමැති අතර, 2023 වර්ෂයේදී VC– 2392 දරන යතුරුපැදිය රු.35,800 ක මුදලකට අලෙවි කර ඇති අතර, එම මුදල් ආදායම් ශීර්ෂ අංක 20.66.02.01 දරන ගිණුමට බැර කර ඇත. තවද, 2024 දෙසැම්බර් 02 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අංක 24/2096/801/004 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව අමාත්‍ය මණ්ඩල සංදේශය අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබ ඇති තීරණය අනුව, සියලුම රාජ්‍ය ආයතන වල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ විෂය පථය යටතේ ඇති රජයේ ආයතන සතු වාහන ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව අපහරණය කිරීමට කටයුතු කල යුතු බව වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2024 දරන 2024.12.18 දින නිකුත් කරන ලද චක්‍රලේකය මඟින් දන්වා ඇත. ඒ අනුව ඉහත චක්‍රලේක ප්‍රකාරව අප අමාත්‍යාංශය යටතේ ඇති වාහන 15 ක් (ඇමුණුම - 01) හඳුනාගෙන ඇති අතර, අදාළ වාහන අපහරණය කිරීම සඳහා මේ වන විට තක්සේරු මණ්ඩලයක් පත්කර ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.
6. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	ඒ අනුව, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ පවතින අවුරුද්දට වඩා වැඩි ණය ශේෂයන්ගේ 2024.07.30 දිනට ණය නිරවුල් කිරීමේ ප්‍රගතිය පහත පරිදි වේ.

කාලය	2024.01.01 දිනට ශේෂය	2024.07.30 දිනට ශේෂය	අයකර ගැනීම
5 ට වැඩි	1,297,832.00	934,604.00	363,228.00
4ත් - 5ත්	215,059.00	215,059.00	-
3ත් - 4ත්	313,713.00	313,713.00	-
2ත් - 3ත්	828,189.00	526,165.00	302,024.00
1ත් - 2ත්	683,878.00	497,234.00	186,644.00
එකතුව	**3,338,671.00**	**2,486,775.00**	**851,896.00**

ස්ථාන මාරු - රු.590,703.00

ස්ථාන මාරු වී ගොස් ඇති නිලධාරීන් තිදෙනාගෙන් අයවිය යුතු රු.590,703.00 ණය ශේෂය වසර 20ක් ඉක්මවා ඇති ණය ශේෂයන් වේ.

- ස්ථාන මාරු වී ගොස් ඇති ඊ.එම්.ඊ.සී. කරුණාසේන හා පී.ජී. ගුණපාල යන නිලධාරීන් දෙදෙනාගෙන් අයවිය යුතු රු.452,853.00ක ණය ශේෂයන් පොතෙන් කපා හැරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇත.
- කේ.ඒ.එස්.කේ.ජයවර්ධන යන අයගෙන් අයවිය යුතු රු.137,850.00 ක ණය ශේෂ කපා හැරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ නමුත් මේ පිළිබඳව අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා විමසීම් කරන ලෙස දන්වා ඇත. එබැවින් දැනට මෙම නිලධාරියා හා ණය ශේෂයන් පිළිබඳව අදාළ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හරහා විමසීම් කර ඇත.

මියගිය නිලධාරීන් - රු. 161,918.00

- ඩබ්.ඩබ්. රූපවතී මියගෙන් අයවිය යුතු රු.45,440.00 ක මුදල රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2024 ට අනුව පොත් වලින් කපාහැර ඇත.
- එම්.එස්.එස්.ආර්.සිල්වා යන අයගෙන් අයවිය යුතු රු.116,478.00 ණය ශේෂය ඇපකරුගෙන් ණය ශේෂය නිරවුල් කර ගැනීම සඳහා අදාළ කටයුතු සිදු කරමින් පවතී.

විශ්‍රාම - රු. 1,329,341.00

- ආර්.ඒ.කේ.සුදත් යන අයගෙන් අයවිය යුතු රු.133,612.00ක ණය ශේෂය නීතිපති දෙපාර්තමේන්තුව මඟින් නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇත.
- සී.එම්.එන්.නන්දලාල් හා කේ.ඒ.නිමල් යන නිලධාරීන් දෙදෙනාගෙන් අයවිය යුතු රු.167,130ක ණය ශේෂය රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2024 ට අනුව පොත් වලින් කපාහැර ඇත.
- යූ.ඩබ්.වනිගවිතාරණ, යූ.එන්.පද්මසිරි, කේ.ඩබ්.ජී.එස්.බණ්ඩාර, කේ.එල්.ආර්.පෙරේරා යන අයගෙන් අයවිය යුතු රු.406,918.00 ක මුදල මේ වන විට නිරවුල් කර ඇත.
- එච්.ඒ.එස්.බණ්ඩා, එම්.එස්.පෙරේරා යන අයගෙන් අයවිය යුතු රු.292,829.00 ක ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස ජාතික ශිෂ්‍යභට බලකාය වෙත දැනුවත් කිරීම් සිදුකර ඇත. එම ආයතනයෙන් අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කෙරේ.

	• ඩී.ජී.දහනායක හා එච්.ඩී.එස්.රූපසිංහ යන අයගේ ණය ශේෂ වන රු.328,852.00 නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස ආපදා කළමනාකරණ අංශය වෙත දැනුවත් කිරීම් සිදු කර ඇත. එම ආයතනයෙන් අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කෙරේ. **<u>වැඩ තහනම් කර ඇති නිලධාරීන් - රු. 244,967.00</u>** • ආර්.එස් ගොඩමුණ ගේ ණය ශේෂය වන රු.100,680.00 ක මුදල නීතිමය ක්‍රියා මාර්ග ගැනීම සඳහා නීති අංශය වෙත දන්වා ඇත. • එල්.ඒ.අබේරත්න ගේ ණය ශේෂය වන රු.40,562.00 ක මුදලින් 2024 අප්‍රේල් මස රු.10,000/- මුදලක් ගෙවා ඇති නමුත් නැවත ණය නිරවුල් නොකිරීම නිසා නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට පෙර මෙම ණය නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. • ඩී.එන්.ද සොයිසා ගේ ණය මුදල වන රු.103,725.00 මාසිකව රු.1000/- බැගින් ගෙවීමට අනුමැතිය ඉල්ලා ඇති අතර, මේ සඳහා අනුමැතිය ලබා දී ඇත. **<u>සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් - රු.1,011,742.00</u>** • එම්.ඩී සමන් කුමාර යන අයගේ ණය ශේෂය වන රු.217,459.00 ක මුදල අවස්ථා කිහිපයකදීම මෙම පුද්ගලයා දැනුවත් කළද මේ සඳහා පිළිතුරු නොමැති බැවින් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ග්‍රාම නිලධාරීන් දැනුවත් කර ඇත. සිහිකැඳවීම් ලිපිද යවා ඇත. • අයි.ජී.එස්.කේ. ප්‍රියදර්ශන යන අයගේ ණය ශේෂය වන රු.138,400.00 සඳහා නීතිමය ක්‍රියා මාර්ග ගැනීම සඳහා නීති අංශය වෙත දන්වා ඇත. • කේ.පී.සී.මධුශංක යන අයගේ ණය ශේෂය වන රු.81,750.00 නිරවුල් කර ඇත. • ඒ.අජිත් කුමාර යන අයගේ ණය ශේෂය වන රු.21,152.00 මුදල මාසිකව රු.1,000.00 වාරික මඟින් ණය නිරවුල් කරමින් පවතී. • ටී.ඒ.ධර්මබන්දු හා එච්.ඒ.පී.එන්. බණ්ඩාර යන අයගෙන් අයවිය යුතු රු.88,658.00 රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2024 ට අනුව පොත් වලින් කපාහැර ඇත. • ඩී.සී.කුමාරරත්න, ඒ.එස්.ඒ.හේමන්ත සහ එච්.ඒ.දිසානායක

	යන අයවලුන්ගේ ණය ශේෂය වන රු.373,600.00 ජාතික ශිෂ්‍යභට බලකාය හරහා අයකර ගැනීමට අබණ්ඩව දැනුවත් කිරීම් සිදු කරමින් පවතී. • ටී.ඒ.ධර්මසේන යන අයගේ ණය ශේෂය වන රු.93,023.00 මුදල කොටස් වශයෙන් නිරවුල් කරමින් පවතී. දැනට රු.45,000.00 ක් ගෙවා ඇත.
7. පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් ඉකුත් තැන්පතු විශ්ලේෂණ වාර්තාවක් සකස් කර සෑම අර්ධ වර්ෂයකම ජාතික විගණන කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
8. මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	ගෙවීම් අංශය විසින් තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම වෙනුවෙන් අග්‍රිම අයදුම්කරුගේ අත්සනින් ලබා ගන්නා අග්‍රිමය නිකුත් කිරීම වෙනුවෙන් බලය ලබාදෙන අයදුම් පත්‍රය නිකුත් කිරීමේදී මූ.රෙ. ප්‍රකාරව නියමිත කාල සිමාව තුල අග්‍රිම පියවීම සම්බන්ධව දැනුවත් කර ඇත. එසේම මෙම අත්තිකාරම් පියවීමට කල් ගත වීම සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන්ගෙන් ලිඛිතව කරුණු විමසීමට හා එම අත්තිකාරම් කඩිනමින් පියවීමට අවශ්‍ය උපදෙස් ලබා දීමටද කටයුතු කර ඇත. නමුත් අමාත්‍යාංශ පරිශ්‍රයට පිටතින් ස්ථාපිත අනුබද්ධ ආයතන වෙනුවෙන් නිකුත් කරනු ලබන අත්තතිකාරම් පියවීමේදී ප්‍රමාධයන් සිදු වන බව නිරීක්ෂණය වන අතර, ඒ සඳහා බොහෝ දුරට වවුචර්පත් සකස් කර ගෙවීම අංශය වෙත ඉදිරිපත් කිරීමට ගතවන කාලය මෙන්ම නිකුත් කරන අත්තිකාරම් මුදල් වලින් ඉතිරි වන මුදල් නැවත අමාත්‍යාංශයේ සරප් කාර්යාලයට ගෙවීම පොදු 172 කුවිතාන්සි ලබා ගැනීමෙන් අනතුරුව එම තොරතුරු ද ඇතුලත් කොට වවුචර්පත් සකස් කිරීමට සිදුවීම, එම වවුචර්පත් ගෙවීම් අනුමැතිය වෙනුවෙන් වෙනත් අංශ වෙත යොමුකර අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමේදී යම් කාලයක් ගත වීම, එසේ ඉදිරිපත් කරන වවුචර්පත් වල පවතින දෝශ නිවැරදි කිරීම සඳහා එම අංශ වෙත යොමුකර නැවත ගෙන්වා ගැනීමේදී සිදුවන ප්‍රමාධයන් අදී කරුණු හේතු වන බව නිරීක්ෂණය වේ. කෙසේ වෙතත් මේ සම්බන්ධව අදාළ අංශ හා ආයතන නැවත දැනුවත් කිරීමට කටයුතු කරන අතර, නැවත මෙවැනි තත්ත්වයන්

	හැකිතාක් දුරට අවමකර ගැනීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් අනුගමනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බවද නියමිත කාල සීමාවෙන් පසුව අත්තිකාරම් පියවීම සඳහා ඉදිරිපත් කරනු ලබන වවුචර්පත් සමඟ එසේ ප්‍රමාධයන් සිදු වීමට අදාළ හේතු ලිඛිතව ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව දැනුම් දෙමි.
9. රැස්කර නිබුණු ආදායම්, සෘජුවම ආදායමට බැර කර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවාගෙන මාසයකට වඩා අඩු කාලයක් ඇතුලත ආදායම් ගිණුමට බැර කර හෝ නොතිබුණි.	මේ වන විට ප්‍රමාදකින් තොරව නිවැරදිව ආදායම් ගිණුමට බැරකිරීම සිදු කරනු ලබයි.
10. අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබුණි.	2022.10.05 දිනැති අංක 2300/24 දරන අති විශේෂ ගැසට් පත්‍රය හා 2022.10.26 දිනැති අංක 2303/17 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව මෙම අමාත්‍යාංශයේ කාර්යය ව්‍යුහයප්‍රතිසංවිධානය කිරීම මත එවකට පැවති රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ අංශය මෙම අමාත්‍යාංශීය විෂය පථය යටතට පත්කර ඇත. මෙම අමාත්‍යාංශය වෙත පුහුණුවට යොමු කරන ලද උපාධිධාරී අභ්‍යාසලාභීන්, සංවර්ධන නිලධාරී සේවයේ ස්ථිර කිරීමෙන් අනතුරුව අනුමත කාර්යය මණ්ඩලය නොසලකා මෙම අමාත්‍යාංශයේම රාජකාරී ඉටු කිරීම සඳහා අනුයුක්ත කිරීම හේතුවෙන් අදාළ නිලධාරීන්ගේ අතිරික්තයක් පෙන්නුම් කලද එම නිලධාරීන් සේවා අවශ්‍යතා මත කළමනාකරණ සේවා නිලධාරී සේවයේ පුරප්පාඩු පවතින තනතුරු වලට අයත් රාජකාරී ඉටු කරන බැවින් මේ වන විට අනුමත කාර්යය මණ්ඩල සීමාව තුල කාර්යය මණ්ඩලය පවතී.
දෙවන කොටස	
01. 2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි	ආරක්ෂක අමාත්‍යාංශය මගින් පුරවැසියන්ට /සේවාලාභීන්ට ලබාදෙන සේවාවන් පිළිබඳ තොරතුරු නිසි පරිදි පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියට අනුකූලව සකස්කර, අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළකර ඇත.

පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	
02. ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි	ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය එම සේවාවන් භාරව කටයුතු කරන අමාත්‍යාංශයේ අදාළ අංශ ප්‍රධානීන් වෙතින් සිදුවන අතර, අවශ්‍යතාවය පරිදි හෝ කාර්තුමය වශයෙන් හෝ අදාළ සේවාවන් සැපයීම සම්බන්ධ කාර්යන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම අමාත්‍යාංශයේ සැලසුම් අංශය විසින් සිදු කිරීමට කටයුතු යොදා ඇත. ඒ අනුව හඳුනාගනු ලබන අවශ්‍යතාවයන්/ වෙනස්වීම් අදාළ අංශ ප්‍රධානීන් මඟින් ක්‍රියාක්මක කෙරේ.
03. සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018(10 මඟින් රාජ්‍ය අංශය තුල මානව සම්පත් සංවර්ධනය කිරීම යන මැයෙන් 2018/01/24 දිනැතිව නිකුත් කරන ලද උක්ත චක්‍රලේකයට අමතර වශයෙන් රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ 2023/11/30 දිනැති ලිපිය මඟින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/2018 හි 1 (ඡේදය) සංශෝධනය කරමින් වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම තව දුරටත් අවශ්‍ය නොවන බව දන්වා ඇත.
04. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.	2023.11.28 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ආරක්ෂක අමාත්‍යාංශයට අදාළව නියෝග 03 ක් ලබාදෙන ලදී. එම නියෝග හා එහි වර්තමාන තත්ත්වය පහත පරිදි වේ. 01. <u>1996 අංක 22 දරන ගිනි අවි (සංශෝධිත) පනත හා පුපුරණ ද්‍රව්‍ය සංශෝධිත පනත සංශෝධනය කිරීම.</u> 1956 අංක 21 දරන පුපුරණ ද්‍රව්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වන අමාත්‍ය මණ්ඩල සංදේශය, ආරක්ෂක අමාත්‍යතුමාගේ අත්සනට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සකසමින් පවතී. අවසන් වරට 1996 අංක 22 දරන පනත මඟින් සංශෝධනය කරන ලද 1916 අංක 33 දරන (182 අධිකාරිය) තුවක්කු ආඥා පනත සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය, අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම සඳහා යොමුකර ඇත.

	02. <u>ත්‍රිවිධ හමුදාව විසින් බාහිර පාර්ශවයන් සඳහා සපයන සේවාවන් මඟින් උපයන ආදායම්.</u> ත්‍රිවිධ හමුදාව විසින් බාහිර පාර්ශවයන් වෙත සපයනු ලබන සේවාවන් වෙනුවෙන් ලැබෙන ආදායම් ප්‍රභවයන් වලින් උපයන ආදායමින් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ආදායම් ප්‍රතිශත පිළිබඳව ආරක්ෂක ලේකම් විසින් ත්‍රිවිධ හමුදාව වෙත අංක MOD/DEF/HRM/GEN/OTHERS/88/(11) දරන 2023.11.03 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත. (ඇමුණුම-02). රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අංක 9/4/2023 හා 2023.12.02 ලිපිය අනුව ත්‍රිවිධ හමුදාවේ කවර ආකාරයක හෝ ආරක්ෂක ගිණුම් හැරෙන්නට විවෘත කර ඇති බැංකු ගිණුම් පිළිබඳව තොරතුරු වාර්තාවන් භාෂාත්‍රයෙන් යුතුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙත අංක MOD/DEF/HRM/GEN/OTHERS/88/(11) හා 2024.01.10 දිනැති ලිපිය මඟින් යොමු කරන ලදී (ඇමුණුම - 03). එසේම ආදායම් බෙදා හැරීමේ ප්‍රතිශත තීරණය කිරීම සඳහා මුදල් ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ එකඟතාවය ලබා ගන්නා ලෙස රාජ්‍ය ගිණුම් කාරක සභාව උපදෙස් දී ඇති බැවින් ඒ පිළිබඳ රජය මුදල් දෙපාර්තමේන්තුවේ PFD/RED/REG/F&C/2024/DEF හා 2024.02.21 දිනැති ලිපිය මඟින් ඉල්ලා ඇති තොරතුරු අංක MOD/DEF/HRM/GEN/OTHERS/88/(11) දරන 2024.04.18 දිනැති ලිපියෙන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂක ජනරාල් වෙත යොමුකර ඇත (ඇමුණම - 04). ත්‍රිවිධ හමුදාව විසින් බාහිර පාර්ශවයන් සඳහා සපයන සේවාවන් මඟින් උපයන ආදායම් වලින් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ආදායම් ප්‍රතිශත පිළිබඳව වැඩිදුර සාකච්ඡා කිරීම සඳහා ත්‍රිවිධ හමුදාවේ හා මෙම අමාත්‍යාංශයේ නිලධාරීන් ගේ සහභාගිත්වයෙන් යුතුව 2024.05.14 හා 2024.08.28 යන දිනයන්හි දී මුදල් ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී රැස්වීම පවත්වන ලදී. තවද, මෙම අමාත්‍යාංශයේ අංක MOD/DEF/HRM/GEN/OTHERS/88/(11) හා 2025.01.27 දිනැතිව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත සපයන ලද තොරතුරු සම්බන්ධයෙන් පවත්වන ලද සාකච්ඡා වලින් අනතුරුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අංක PFD/RED/REG/F7C/2025/DEF හා 2025.03.05 දැනැති ලිපිය මඟින් එම සේවා වලින් ලබන ශුද්ධ ආදායමෙන් ඒකාබද්ධ අරමුදලට බැර කල යුතු ප්‍රතිශත සංශෝධනය කර ඇති බව මෙම අමාත්‍යාංශය වෙත දන්වා ඇත. (ඇමුණුම - 05)

	තවද, එම ගාස්තු අයකිරීම තුලින් ලැබෙන ශුද්ධ ආදායමෙන් ඒකාබද්ධ අරමුදලට බැර කල යුතු ප්‍රතිශත, ආදායම් ශීර්ෂ 2003-99-00 යටතේ ගිණුම්ගත කල යුතු බවද මෙම සේවාවන් සැපයීම හා සම්බන්ධ කරුණු කිහිපයක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසද එම ලිපියෙහි සඳහන් කර ඇත. එසේම, ත්‍රිවිධ හමුදාව වෙත මෙම හමුදාමය රාජකාරීන් නොවන ව්‍යාපාර, සේවාවන් හි නිරත වීම සුදුසු නොවන බැවින් පෞද්ගලික අංශය වෙතින් මෙම සේවාවන් සිදුකර ගැනීම සුදුසු බවද දන්වා ඇති අතර, තවද ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයන් වෙනත් පරිභාහිර කටයුතුවල නිරත වන බව නිරීක්ෂණය වී ඇති බැවින් එම තත්ත්වය අවම කර ගැනීමට කටයුතු කරන ලෙසද වැඩි දුරටත් දන්වා ඇත. 03. <u>ත්‍රිවිද හමුදාවන් සඳහා ආහාර ද්‍රව්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ සියලුම ආයතන සම්බන්ධ කරමින් තොරතුරු කළමනාකරණ පද්ධතියක් සැකසීම.</u> මෙම නිරීක්ෂණය සඳහා වන වර්තමාන තත්ත්වය යුද්ධ හමුදා සැපයීම් හා ප්‍රවාහන අධ්‍යක්ෂක මණ්ඩලය වෙතින් ගෙන්වා ගන්නා ලද අතර, එම පිළිතුර මෙයට ඇමුණුම-06 වශයෙන් ඉදිරිපත් කරමි.
05. ආයතනයේ ගිණුම් පිළිබඳ මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය. පහත සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් ආරක්ෂක අමාත්‍යාංශය සඳහා තත්ත්වාගණනය කල මතයක් 2022 මූල්‍ය ප්‍රකාශන සඳහා නිකුත් කර ඇත. **<u>විගණන නිරීක්ෂණය</u>** I. සමාලෝචිත වර්ෂය තුල ආදායම් සංකේතාංක 20.03.06.00 එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් ලද ආදායම් ලෙස ශ්‍රී ලංකා යුධ හමුදාව හා ගුවන් හමුදාව පිළිවෙලින් එක්සත් ජනපද ඩොලර් 8,211,373.98 හා 10,965,751.85 ක්	ආදායම් සංකේත 20.03.06.00 එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් වෙනුවෙන් 2021.12.31 දිනට අයවිය යුතුව පැවති හිඟ ආදායම ඇ.ඩො.9,954,774ක් වූ අතර, මූල්‍ය ප්‍රකාශයේ ඒසිඒ 1 ආකෘතිය අනුව සමාලෝචිත වර්ෂය තුල හිඟ ආදායම් රැස් කිරීමක් හෝ හිඟ ආදායම් කපා හැරීමක් සිදු නොකල බව විගණනයට නිරීක්ෂණය වී ඇත. මෙම හිඟ ආදායමින් ඇ.ඩො. 9,610,215 ක වටිනාකම 2022.12.31 දින වන විට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සහ ගුවන් හමුදාව

ලෙස එකතුව එක්සත් ජනපද ඩොලර් 19,177,125.83 ක් රැස්කර ඇතත්, ඒසීඒ -1 ආදායම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස එක්සත් ජනපද ඩොලර් 7,506,868.47 ක් හෙවත් රු. 2,447,153,974 ක් පමණක් දක්වා තිබුණි. තවද මෙම ආදායමින් එක්සත් ජනපද ඩොලර් 8,057,402.58 ක් 2022 දෙසැම්බර් 31 දිනෙන් පසුව රාජ්‍ය ආදායමට බැරකර තිබුණු අතර එක්සත් ජනපද ඩොලර් 3,612,804.78 ක් ණයවර ලිපි විවෘත කිරීමේ පහසුව සඳහා භාණ්ඩාගාර එකඟතාව මත යුධ හමුදා විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක රඳවා ගෙන තිබුණි. ඒ අනුවසමාලෝචිත වර්ෂයේ ආදායම එක්සත් ජනපද ඩොලර් 11,670,207.36 ක ආදායමක් ගිණුම් තුලින් නිරූපනය නොවුණි. 2022 දෙසැම්බර් 31 දිනට පැවති විනිමය අනුපාත අනුව එම අගය රු.4.205,942,732.54 ක් විය. තවද මෙම රඳවා ගත් ආදායම පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුලින් අනාවරණය කර නොතිබුණි. එසේම යුධ හා ගුවන් හමුදාවන් විසින් සමාලෝචිත වර්ෂය තුල දී පූර්ව වර්ෂයට අදාලව හිඟ හිටි ආදායම රැස්කර ඇතත් ගිණුම් ඉදිරිපත් කිරීමේදී නිවැරදි වර්ගී කරණයන් යටතේ පූර්ව වර්ෂයට අදාල ආදායම් ලැබීම් දක්වා නොතිබුණි.	විසින් අයකර ගෙන ඇත. මෙම අයකර ගැනීම ඒසීඒ I ආකෘතියේ හිඟ ආදායම් රැස්කිරීම (3) යටතේ පෙන්නුම් නොකර අදාළ වර්ෂය තුල රැස් කිරීම් 2(ii) යටතේ දක්වා ඇත. ඉදිරියේදී මෙලෙස වර්ෂය තුලදී අයකරගනු ලබන හිඟ ආදායම් නිවැරදි ආකාරයට මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. ඇ.ඩො.344,559 ක මුදලක් පමණක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙතින් අය වීමට ඇති අතර, මෙම හිඟ හිටි ආදායම අයකර ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය හරහා එක්සත් ජාතීන්ගේ මූලස්ථානය දැනුවත් කර ඇති බව ගුවන් හමුදාව විසින් දන්වා ඇත. 2022 වර්ෂයේ ආරම්භක හිඟ ශේෂය ඇ.ඩො.9,610,215 ක් ලෙස ඒසීඒ 1 ආකෘතියට අනුව විගණනය විසින් නිරීක්ෂණය කර ඇත. නමුත් එම මුදල ඉහත පරිදි අයකර ගෙන ඇති අතර, සත්‍ය වශයෙන්ම ආරම්භක හිඟ ශේෂය වන ඇ.ඩො.344,559 ක වටිනාකම පමණක් 2021 වර්ෂයට අදාළ වන අතර, එය දකුණු සුඩානයේ සාමසාධක මෙහෙයුම් රාජකාරි වෙනුවෙන් අයවීමට ඇති හිඟ හිටි වටිනාකම වේ. 2022 වර්ෂය තුළදී විනිමය අනුපාතය දැඩි ලෙස උච්චාවචනය වීම හේතුවෙන් ශ්‍රී ලංකා රුපියලේ අගය ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව විවලනයට ලක්වීමක් සිදු විය. විගණනය විසින් ඇමෙරිකානු ඩොලරයක වටිනාකම ශ්‍රී ලංකා රුපියල් 360.40 ක් ලෙස ගෙන වර්ෂය තුළ රැස් කළ ආදායමෙහි වටිනාකම ඇ.ඩො.6,790,105 ක් ලෙස ගණනය කර ඇත. නමුත් භාණ්ඩාගාර මුද්‍රිත අනුව සාම සාධක මෙහෙයුම් ආදායම 2022 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි මාසයන් සඳහා පැවති විනිමය අනුපාතය අනුව රු.198.50 බැගින් හා සැප්තැම්බර් මස රු. 359.20 ක් ලෙස ගෙන 2022 වර්ෂය තුළ මුළු ආදායම රු.2,447,153,974 ක් ලෙස ගිණුම්ගත කර ඇත. තවද, ශ්‍රී ලංකා යුද්ධ හා ගුවන් හමුදාවේ විදේශ ව්‍යවහාර ගිණුම් (NRFC) තුළ මෙම ආදායම භාණ්ඩාගාරය වෙත යොමු කරන තෙක් රඳවා ගනු ලබන අතර, මුදල් අමාත්‍යාංශය වෙතින් ලබාදෙන අනුමැතිය මත එම රඳවාගනු ලබන ආදායම, හමුදාවන් දෙක වෙනුවෙන් කරනු ලබන ඩොලර් වියදම් දැරීමේදී 20.03.06.00 දරණ ආදායම් ශීර්ෂය වෙත බැර කර අදාළ ගෙවීම් සිදු කරනු ලැබේ.

	එබැවින් අදාළ ආදායම 2022 වර්ෂය තුළ ගිණුම් ගත වීමක් සිදු නොවුන ද සාම සාධක මෙහෙයුම් රාජකාරි වෙනුවෙන් අදාළ විදේශ ව්‍යවහාර ගිණුම් වෙත ලැබී ඇති බැවින්, හිග ආදායම් ලෙස වාර්තා කර නොමැත. තවද, මෙලෙස විදේශ ව්‍යවහාර ගිණුම වෙත බැර කරනු ලබන ආදායමෙන් අදාළ සාම් සාධක හමුදාවන්ගේ වැටුප් හා වේතන වෙනුවෙන් වැය දැරීමක් සිදු කරන අතර, කිසිදු අවස්ථාවක එම ඩොලර් වටිනාකම මුදල් අමාත්‍යාංශය හරහා අදාළ ආදායම් ශීර්ෂය වෙත බැර කිරීමක් සිදු නොවේ. ඉහත කරුණු හේතුවෙන් ඔබ විසින් නිරීක්ෂණය කර ඇති පරිදි වර්ෂයේ ලද ආදායම වන රු.2,447,153,974ක වටිනාකම තුළ 2021 වර්ෂය වෙනුවෙන් අය කරන ලද හිඟ ආදායම් සියල්ලම ගිණුම්ගත නොවුවත්, ඇ.ඩො. 344,559 ක වටිනාකම හැර සියලුම හිඟ ආදායම අයකර ගෙන ඇති බවත් මින් ඉදිරියට ආදායම් ගිණුම් පිළියෙල කිරීමේදි මෙලෙස සිදුවන වෙනස්වීම් පිළිබඳ සටහනක් මගින් කරුණු දැක්වීමක් සිදු කරනු ඇත.
II. මුදල් රෙගුලාසි 128(2)(ඇ) හා 1/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද 2022 දෙසැම්බර් 31 දිනට හිඟ ආදයම් ප්‍රකාශයෙහි සහ ACA - 1 (i) ආකෘතියෙහි හිඟ හිටි ආදායම අතර රු. 626,500 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර 2019 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි බලපත්‍ර ගාස්තු ආදායම ACA - 1(i) ආකෘතියෙහි දක්වා නොතිබීම මෙම වෙනසට හේතු වී තිබුණි.	10.03.07.05 ආදායම් ශීර්ෂයට අදාළව 2022.12.31 දිනට හිඟ ආදායම් වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශනයේ ඒසීඒ- 1(i) ආකෘතියෙහි හිඟ හිටි ආදායම අතර වෙනස රු.626,500 ක් ලෙස විගණනය නිරීක්ෂණය කර ඇති අතර, 2019.12.31 දිනට හිඟ හිටි බලපත්‍ර ගාස්තු ආදායම ඒසීඒ- 1(i) ආකෘතියෙහි දක්වා නොතිබීම මෙම වෙනසට හේතුව බව විගණනය විසින් පෙන්වා දී ඇත. ඉදිරියේදී පෙර වර්ෂයන්හි හිඟ ශේෂයන් ද එකතු කර මෙම අගය ගණනය කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත.
III. 2019 වර්ෂය තුළ රැස්කල ශුද්ධ ආදායම රු.21,372,185,188 ක් වුවත්, ACA - 1(i) ආකෘතියෙහි පසුගිය වර්ෂ 03 හිදී රැස්කල ශුද්ධ ආදායම දැක්වීමේදී 2019 වර්ෂය තුළ රැස්කල ශුද්ධ ආදායම	2019 වර්ෂය තුල රැස්කල ශුද්ධ ආදායම රු.21,372,185,188 ක් වුවත්, ඒසීඒ - 1(i) ආකෘතියෙහි පසුගිය වර්ෂ 03 හි දී රැස්කල ශුද්ධ ආදායම දැක්වීමේදී 2019 තුල රැස්කල ශුද්ධ ආදායම රු.2,802,302,525ක් ලෙස දක්වා තිබීම විගණනයට නිරීක්ෂණය වී ඇත.

රු.2,802,302,525 ක් ලෙස දක්වා තිබුණි.	2020, 2021 සහ 2022 මුල්‍ය ප්‍රකාශන වල ඒසිඒ - 1(i) ආකෘතියෙහි පසුගිය වර්ෂ 03 හි දී රැස්කල ශුද්ධ ආදායම යටතේ 2019 වර්ෂයට අදාළ ශුද්ධ ආදායම රු.2,802,302,525 ක් ලෙස දක්වා ඇති අතර, 2019 වර්ෂය තුල රැස්කල ශුද්ධ ආදායම වනුයේ විගණනය නිරීක්ෂණය කර ඇති පරිදි රු.21,372,185,188 ක් බව බව ආරක්ෂක අමාත්‍යාංශයේ 2019 මුල්‍ය ප්‍රකාශනය අනුව ද තහවුරුවනු ලැබේ. මෙලෙස 2019 වර්ෂයේදී රැස්කළ ආදායම ලෙස රු.2,802,302,52 5ක් 2020 වර්ෂයේ සිට මුල්‍ය ප්‍රකාශනයන්හි දක්වා ඇත්තේ වැරදීමකින් වන අතර, මෙම වටිනාකම 2019 වර්ෂයට අදාළව හිඟහිටි ආදායම වේ. කෙසේ වෙතත් ආසන්න පූර්ව වර්ෂ 03 හි ශුද්ධ ආදායම අවසාන ගිණුම් ප්‍රකාශය යටතේ දක්වන බැවින්, 2023 වර්ෂයේ මෙම ආදායම පිළිබඳ ඇතුළත් කිරීමක් සිදු නොවේ. 2020 වර්ෂයේ අවසාන ගිණුම් සඳහා ඉදිරිපත් කළ දත්ත පදනම්ව 2021, 2022 වර්ෂයේ අවසාන ගිණුම් සකස් කර ඇති බැවින්, මෙවැනි වරදක් සිදුව ඇති අතර, ඉදිරියේදී නිවැරදි තොරතුරු මත පදනම්ව අවසන් ගිණුම් සකස් කිරීමට පියවර ගෙන ඇත.
IV. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන පොත්පත් හා භාණ්ඩාගාර පොත් (SA-52) සමඟ සැසඳීමේදී අත්තිකාරම් ලැබීම (0-0-103-0-11-0) සම්බන්ධයෙන් රු. 6,750 ක වෙනසක් හා අත්තිකාරම් ගෙවීම් (0-0-103-0-11-0) සම්බන්ධයෙන් රු.231,174 ක වෙනසක් පැවති බව නිරීක්ෂණය විය.	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අනුව තැන්පතු ලැබීම් හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව තැන්පතු ලැබීම් අතර වෙනසට හේතුව පහත පරිදි වේ. | | **තැන්පතු ලැබීම් (රු.)** | | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය අනුව | 599,770,908.00 | | මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව | 571.627,250.00 | | **වෙනස** | **28,143,658.00** | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/05 3.1 ප්‍රකාරව CIGAS ඩෙක්ස්ටොප් යොමුව මඟින් උත්පාදනය කර ගන්නා ලද ශේෂ පිරික්සුම හා අවසන් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් උපයෝගී කරගෙන අවසන් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළයුතු බවට මාර්ගෝපදේශ නිකුත් කර ඇත. ඒ අනුව ආරක්ෂක අමාත්‍යාංශයේ 2022.12.31 දිනට පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය CIGAS මඟින් උත්පාදනය කරන ලද ශේෂ

	පිරික්සුම පදනම් කරගෙන පිළියෙල කරන ලදි. 2022.12.31 දින පැවති ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව තැන්පතු ලැබීම් හා ගෙවීම් ලෙස රු.571,627,250.00 ක් හා රු.168,694,868.00 ක් දක්වා ඇත. නමුත් මූල්‍ය කාර්ය සාධන වාර්තා තුල තැන්පතු ලැබීම් හා තැන්පතු ගෙවීම් ලෙස රු.599,770,908.00 ක් හා රු.173,252,157.00 ක් ලෙස දක්වා ඇත. එම අගය මාර්ගෝපදේශ ප්‍රකාරව ACA 4 මඟින් පෙන්වන අගය වන අතර, එම අගය 2022.12.31 දින භාණ්ඩාගාරයේ මුද්‍රිත සටහන් වල දැක්වෙන අගය වේ. නීරීක්ෂණයේ දක්වා ඇති වෙනස වූ රු.23,586,369.00 ක් වෙනත් දෙපාර්තමේන්තුවක් වෙතින් තැන්පතු ගිණුමට ලද බලපෑම වන අතර, අග්‍රිම සැසඳුම් ප්‍රකාශනයේ එම අගය දක්වා ඇත.
V. 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන චක්කම් කළමනා කරණ චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන චක්කම් තක්සේරු කළ යුතු වුවත් 2012 පෙබරවාරි 15 දින ආරක්ෂක අමාත්‍යාංශයට වෙත පවරා තිබුණු ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය පිහිටි හෙක්ටයාර් 21.0437 ක ඉඩම් කොටස හා සුහුරුපාය ගොඩනැගිල්ල පිහිටි හෙක්ටයාර් 1.4164 ක ඉඩම් කොටස් තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	ආරක්ෂක අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන පොත්පත් හා භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් සැසඳීමේ දී සඳහන් වෙනස්කම් පහත පරිදි වේ. <u>103-0-11 මුළු හර කිරීම්වල වෙනසට හේතු</u> **මාසය** / **අමාත්‍යාංශ පොත් අනුව** / **භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව** / **වෙනස** ජනවාරි 1,072,600 1,072,600 පෙබරවාරි 306,142 326,142 (20,000) මාර්තු 2,933,785 2,933,785 20,000 අප්‍රේල් 19,718,754 19,718,754 මැයි 401,029 401,029 ජුනි 2,428,658 2,428,633 25 ජුලි 384,210 384,210 අගෝස්තු 3,632,011 3,632,011 සැප්තැම්බර් 1,122,572 1,122,572 ඔක්තෝබර් 2,877,288 2,877,288 නොවැම්බර් 4,949,449 4,959,449 (10,000) දෙසැම්බර් 19,021,122 19,030,373 (9,250) **භාණ්ඩාගාර මුද්‍රිත සටහන හා අමාත්‍යාංශ පොත් අනුව වෙනස** **(19,225)**

පවරා ගත යුතු ණය වාරිකය වැරදීමකින් පවරා නොගැනීම			12,500
			(6,725)
අවසාන ගිණුම් මගින් අනාවරණය කළ වැරදි නිවැරදි කිරීම			(25)
			(6,750)

මාසය	ශීර්ෂය	හර වෙනස	හේතුව
ඔක්තෝබර්	103-011	(12,500)	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අනුයුක්ත නිලධාරියාට අදාළ අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් බැර කරන ලද රු.12,500.00 ක ආපදා ණය වාරික ශේෂයක් අදාළ නොවන වාරික මුදලක් ලෙස සලකා ඔක්තෝබර් මාසයේදී ඔවුන් වෙත පවරාදෙන ලදී. පසුව නැවත පරීක්ෂා කිරීමක දී එම ශේෂය ආපදා සහන සේවා නිලධාරියකුගේ වාරික මුදලක් බැවින් නැවත එම මුදල නොවැම්බර් මාසයේ දී පවරා ගන්නා ලදී.
නොවැම්බර්	103-011	10,000	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අනුයුක්ත ආර්.ඊ.යූ.අයි. රතුගම මහතාගේ ණය ශේෂය පවරා ගැනීම.
දෙසැම්බර්	103-011	3,000	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අදාළව නොවැම්බර් මස දෙහිවල ප්‍රා.ලේ කාර්යාල විසින් කල වැරදි බැර කිරීම රු. 3000/= නිවැරදි කිරීම.
		6,250	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අදාළව ඇලපාත ප්‍රා.ලේ කාර්යාලය මඟින් කල වැරදී බැර කිරීම නිවැරදි කිරීම.
එකතුව		6,750	

<u>103-0-11 මුළු බැර කිරීම්වල වෙනසට හේතු</u>

මාසය	අමාත්‍යාංශ පොත් අනුව	භාණ්ඩාගාර මුද්‍රිත සහටන් අනුව	වෙනස
ජනවාරි	3,759,187.48	3,761,787.91	(2,600.43)
පෙබරවාරි	4,135,050.50	4,137,650.93	(2,600.43)
මාර්තු	3,816,657.60	3,819,258.03	(2,600.43)
අප්‍රේල්	4,181,590.66	4,184,191.09	(2,600.43)
මැයි	5,913,802.88	5,916,294.74	(2,491.86)
ජූනි	6,010,257.48	6,024,251.64	(13,994.16)
ජූලි	5,898,588.48	5,901,339.39	(2,750.91)
අගෝස්තු	6,103,117.48	6,105,837.16	(2,719.68)
සැප්තැම්බර්	6,855,627.10	6,858,380.53	(2,753.43)
ඔක්තෝබර්	7,538,153.89	7,586,614.00	(48,460.11)
නොවැම්බර්	7,693,210.04	7,759,566.69	(66,356.65)
දෙසැම්බර්	16,522,400.00	16,612,705.17	(90,305.17)
භාණ්ඩාගාර මුද්‍රිත සටහන හා අමාත්‍යාංශ පොත් අනුව වෙනස			**(240,233.69)**
වැරදීමකින් පවරා නොගත් ආපදා ණය වාරිකය නැවත පවරා ගැනීම			**12,500.00**
			(227,733.69)
අවසාන ගිණුම් මඟින් අනාවරණය කළ වැරදි නිවැරදි කිරීම			**(3,441.00)**
			(231,174.69)

මාසය	ශීර්ෂය	බැර වෙනස	හේතුව
ජනවාරි	112	2,600.43	ඒ.එෆ්.එම්.ෆයිස්කාන් - තාවකාලිකව විදේශගතව් රාජකාරී කිරීමේදී වැටුප් ගෙවීම විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් සිදුකරන බැවින් එම නිලධාරීන්ගෙන් අයකරන ලද ආපදා ණය වාරිකය භාණ්ඩාගාර මුද්‍රිත හරහා බැරවීම.
පෙබරවාරි	112	2,600.43	- එම -

	මාර්තු	112	2,600.43	- එම -
	අප්‍රේල්	112	2,600.43	- එම -
	මැයි	112	2,491.86	- එම -
	ජුනි	112	13,994.16	කේ.ඩී.කුමාර - තාවකාලිකව විදේශගතව රාජකාරී කිරීමේදී වැටුප් ගෙවීම විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් සිදුකරන බැවින් එම නිලධාරීන්ගෙන් අයකරන ලද ආපදා ණය වාරිකය භාණ්ඩාගාර මුද්‍රිත හරහා බැරවීම.
	ජූලි	112	2,750.91	- එම -
	අගෝස්තු	112	2,719.68	- එම -
	සැප්තැම්බර්	112	2,753.43	- එම -
	ඔක්තෝම්බර්	103-11	45,709	ආපදා සහන සේවා මධ්‍යස්ථානයට අදාළව ප්‍රා.ලේ. කාර්යාල වලට අනුයුක්තව සේවයේ නියුක්ත නිලධාරීන්ගේ ආපදා ණය වාරික භාණ්ඩාගාර මුද්‍රිත හරහා බැර වීම්වල එකතුව.
			2,751.11	කේ.ඩී.කුමාර - තාවකාලිකව විදේශගතව රාජකාරී කිරීමේදී වැටුප් ගෙවීම විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් සිදුකරන බැවින් එම නිලධාරීන්ගෙන් අයකරන ලද ආපදා ණය වාරිකය.
	නොවැම්බර්	103-11	(12,500.00)	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට අනුයුක්ත නිලධාරියාට අදාළ අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් බැර කරන ලද රු.12,500.00 ක ආපදා ණය වාරික ශේෂයක් අදාළ නොවන වාරික මුදලක් ලෙස සලකා ඔක්තෝබර් මාසයේදී ඔවුන් වෙත පවරා දෙන ලදී. පසුව නැවත පරීක්ෂා කිරීමක දී එම ශේෂය ආපදා සහන සේවා නිලධාරියකුගේ වාරික මුදලක් බැවින් නැවත එම මුදල නොවැම්බර් මාසයේ දී පවරා ගන්නා ලදී.
			63,604.00	ආපදා සහන සේවා මධ්‍යස්ථානයට අදාළව ප්‍රා.ලේ. කාර්යාලවලට

			අනුයුක්තව සේවයේ නියුක්ත නිලධාරීන්ගේ ආපදා ණය වාරික භාණ්ඩාගාර මුද්‍රිත හරහා බැර වීම් වල එකතුව.
		2,752.65	කේ.ඩී.කුමාර - තාවකාලිකව විදේශගතව රාජකාරී කිරීමේදී වැටුප් ගෙවීම විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් සිදුකරන බැවින් එම නිලධාරීන්ගෙන් අයකරන ලද ආපදා ණය වාරිකය.
දෙසැම්බර්	103-11	87,554.00	ආපදා සහන සේවා මධ්‍යස්ථානයට අදාළව ප්‍රා.ලේ. කාර්යාලවලට අනුයුක්තව සේවයේ නියුක්ත නිලධාරීන්ගේ ආපදා ණය වාරික භාණ්ඩාගාර මුද්‍රිත හරහා බැර වීම්වල එකතුව.
		2,751.17	කේ.ඩී.කුමාර - තාවකාලිකව විදේශගතව රාජකාරී කිරීමේදී වැටුප් ගෙවීම විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් සිදුකරන බැවින් එම නිලධාරීන්ගෙන් අයකරන ලද ආපදා ණය වාරිකය.
		3,441.00	ගලිගමුව ප්‍රාදේශීය කාර්යාලය විසින් වැරදීමකින් බැර කරන ලද ආපදා ණය වාරිකය
එකතුව		**231,174.69**	-

ඔක්තෝබර් මාසයේ රු.45,709/- ට අදාළ ණය වාරික පිළිබඳ නොරතුරු

බැර කළ ශීර්ෂය	එකතුව	නිලධාරියාගේ නම
255	8,737	කේ.ඒ. ගුණසේන 2482 + යූ.ඕ.එස්.ප්‍රියදර්ශනී 2905 + එල්.ඒ.ඒ.එන්.ගුණසේන 3350
256	2500/=	එච්.එස්.මල්ලවආරච්චි 1250 + එස්.ඒ.ඩී.කේ.කේ.කුමාර 1250
257	3,149	එස්.ජී.කුමාර 3149
258	2,850	ඩබ්.එම්.අයි. දිසානායක 2850
260	1,250	ඒ.ඒ.එම්.කේ.එස්.ගාන්ධි 1250
262	4,373	ඩබ්.ඩී.ආර්.මල්කාන්ති 1873 + එස්.ඒ.ආර්.උදයංග 2500

263	1,250	කේ.ආර්.රත්නකුමාර 1250
272	10,350	ආර්.ජේ.තමරා 1250 + වයි.එච්.ඒ.එස්.කරුණාරත්න 2850 + එස්.එම්.ටී.කේ.සමරකෝන් 1250 + එම්.බී.එල්.හරිස්චන්ද්‍ර 1250 + ආර්.එම්.ඩබ්.ලංකාතිලක 1250 + එච්.එම්.එන්.එල්.හේරත් 1250 + එච්.එම්.සී.හේරත් 1250
274	2,500	ජී.ඒ.කේ.සඳමාලි 1250 + එම්.එච්.එම්. මල්ෂානි 1250
276	5,000	ඒ.එම්.ප්‍රසන්න 1250 + ආර්.එම්.ජේ.රංජන් 1250 + එස්.බී.එස්.කේ. ප්‍රියදර්ශනී 2500
278	2500	ජේ.ඒ.එස්.මධුක 1250 + කේ.එන්.යූ.ආර්.කුමාර 1250
279	1,250	ඩී.ජී.ඩී.ආර්.කරුණාසේන 1250
	45,709	

නොවැම්බර් මාසයේ රු.63,604/- ට ණය වාරික පිළිබඳ තොරතුරු

බැර කළ ශීර්ෂය	එකතුව	නිලධාරියාගේ නම
255	8,832	කේ.ඒ.ගුණසේන 2482 + දෙහිවල ප්‍රා. ලේ 3000 (වැරදි බැර කිරීම)+එල්.ඒ.ඒ.එන්.ගුණසේන 3350
256	2,500	එච්.එස්.මල්ලවආරච්චි 1250 + එස්.ඒ.ඩී.කේ.කේ.කුමාර 1250
257	3,149	එස්.පී.කුමාර 3149
258	2,850	ඩබ්.එම්.අයි.දිසානායක 2850
260	6,250	ඒ.ඒ.එම්.කේ.එස්.ගාන්ධි 6250
262	4,373	ඩබ්.ඩී.ආර්.මල්කාන්ති 1873 + එස්.ඒ.ආර්.උදයංග 2500
263	1,250	කේ.ආර්.රත්නකුමාර 1250
269	4,050	එම්.එස්.කුමාර 4050

271	2,500	එස්.අසාද් 2500
272	10,350	ආර්.ජේ.තමරා 1250 + වයි.එච්.ඒ.එස්. කරුණාරත්න 2850 + එස්.එම්.ටී.කේ.සමරකෝන් 1250 + එම්.බී.එල්.හරිස්චන්ද්‍ර 1250 + ආර්.එම්.ඩබ් ලංකාතිලක 1250 + එච්.එම්.එන්.එල්.හේරත් 1250 + එච්.එම්.සී.හේරත් 1250
274	2,500	ජී.ඒ.කේ. සඳමාලි 1250 + එම්.එච්.එම්.මල්ෂානි 1250
276	5,000	ඒ.එම්.ප්‍රසන්න 1250 + ආර්.එම්.ජේ.රංජන් 1250 + එස්.බී.එස්.කේ.ප්‍රියදර්ශනී 2500
278	2,500	ජේ.ඒ.එස්.මධුක 1250 + කේ.එන්.යූ.කුමාර 1250
279	2,500	ඩී.ජී.ඩී.ආර්.කරුණාසේන 1250 + ආර්.ඊ.යූ.අයි.රතුගම 1250
270	5,000	එස්.සිවකාදන් 5000
	63,604	

දෙසැම්බර් මාසයේ රු.87,554/- ණය වාරික පිළිබඳ තොරතුරු

බැර කළ ශීර්ෂය	එකතුව	නිලධාරියාගේ නම
255	37.782	කේ.ඒ.ගුණසේන 2482 + එම්.එස්.එච්.ප්‍රනාන්දු 31,950 + එල්.ඒ.ඒ.එන්.ගුණසේන 3350
256	2,500	එච්.එස්.මල්ලවආරච්චි 1250 + එස්.ඒ.ඩී.කේ.කේ.කුමාර 1250
257	3,149	එස්.පී.කුමාර 3149
258	2,850	ඩබ්.එම්.අයි.දිසානායක 2850
262	1,873	ඩබ්.ඩී.ආර්.මල්කාන්ති 1873
263	1250	කේ.ආර්.රත්නකුමාර 1250
269	4,050	එම්.එස්.කුමාර 4050
270	5,000	එස්.සිවකාදන් 5000
271	1,250	එස්.අසාද් 1250
272	10,350	ආර්.ජේ.තමරා 1250 + වයි.එච්.ඒ.එස්. කරුණාරත්න 2850 + එස්.එම්.ටී.කේ.සමරකෝන් 1250 +

		එම්.බී.එල්.හරිස්චන්ද්‍ර 1250 + ආර්.එම්.ඩබ්.ලංකාතිලක 1250 + එච්.එම්.එන්.එල්.හේරත් 1250 + එච්.එම්.සී.හේරත් 1250
274	2,500	ජී.ඒ.කේ.සඳමාලි 1250 + එම්.එච්.එම්.මල්ෂානි 1250
276	5,000	ඒ.එම්.ප්‍රසන්න 1250 + ආර්.එම්.ජේ.රංජන් 1250 + එස්.බී.එස්.කේ.ප්‍රියදර්ශනී 2500
278	8,750	ජේ.ඒ.එස්.මධුක 1250 + කේ.එන්.යූ.කුමාර 1250 + ඇලපාත ඩී එස් (වැරදි බැර කිරීම) 6250
279	1,250	ඩී.ජී.ඩී.ආර්.කරුණාසේන 1250
එකතුව	**87,554**	

VI. අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශය අනුව භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිම ප්‍රමාණය රු. 11,578,631,743 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ අග්‍රිම ලැබීම් ලෙස රු. 12,066,410,675 ක් දක්වා තිබුණු අතර ඒ අනුව අග්‍රිම ලැබීම රු. 487,778,932 ක් වැඩියෙන් දැක්වුණි. තවද එම ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම වටිනාකම රු. 10,371,888 වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු, 498,150,820 ක් ලෙස රු. 487,778,932 ක් වැඩියෙන් දක්වා තිබුණි. ඒ අනුව නිවැරදි අගයන් පදනම්කර ගනිමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආකෘතිය තුල ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී මුදල් වැය කිරීම් යටතේ භෞතික වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හෝ වෙනත් ආයෝජන අත්කර ගැනීම් යටතේ වියදම සටහන් කළ යුතු වූ අතර, මෙහෙයුම් ක්‍රියාකාරකම් වල මුදල් වැය කිරීම් යටතේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යන වර්ගීකරණය යටතේ වියදම් දැක්විය යුතු වේ.

මෙහිදී වැය විෂය අංක 2001, 2002 හා 2003 මගින් දරණ ලද වියදම් මගින් වත්කම් වල ඵලදායී ජීව කාලය වැඩිවීම, වත්කම් භාවිතයේ කාර්යක්ෂමතාවය වර්ධනය වීම හා වත්කම් අගය වැඩිවීම සිදුවන බැවින් එම වැය විෂයන්ගේ වියදම් වටිනාකම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් වැය කිරීම් යටතේ සටහන් කරන ලදි.
කාර්ය මණ්ඩල පුහුණුව සඳහා වන වැය විෂය අංක 2401 මඟින් දරන ලද වියදම් මඟින් මානව ප්‍රාග්ධනයේ කුසලතා සංවර්ධනය වීම හා කාර්යක්ෂමතාවය වර්ධනය වීම සිදුවන අතර, එමනිසා 2401 වැය විෂය යටතේ දරණ ලද ප්‍රාග්ධන වියදම ආයෝජන ක්‍රියාකාරකම්හි මුදල් වැය කිරීම් යටතේ දක්වන ලදි. රාජ්‍ය ආයතන සඳහා ප්‍රාග්ධන මාරු කිරීම්ද ප්‍රාග්ධන වියදමක් ලෙස හඳුනාගෙන ආයෝජන ක්‍රියාකාරකම්හි මුදල් වැය කිරීම් යටතේ දක්වන ලදි.

ඩී.කේ.එච්. කෝලිත
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ

2. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු / කමිටුව විසින් ලබාදෙන ලද මාර්ගෝපදේෂ	අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ආයතනය ගත් ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය
පළමු කොටස	
1. 2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළමුවන මුරපදය ගණකාධිකාරි හෝ අවසර ලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතාකර නොතිබුණි.	වැටුප් සැකසීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළමුවන මුරපදය මාණ්ඩලික නිලධාරියෙකු (මාණ්ඩලික නිලධාරි 1 - තොරතුරු තාක්ෂණ) භාරයේ පවතී.
2. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත්කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	යුද්ධ හමුදාව විසින් පිළිතුරු ලබාදී ඇති පරිදි ජාතික විගණන කාර්යාල විගණන විමසුම් සඳහා නියමිත කාලසීමාව තුළ පිළිතුරු සැපයීම සඳහා උපරිම වශයෙන් ක්‍රියාකර ඇත. කෙසේ නමුත් ඇතැම් විගණන විමසුම් මඟින් ඉල්ලුම්කර ඇති තොරතුරුවල සංකීර්ණතාවය, ගනුදෙණු විශාල සංඛ්‍යාවක් පැවතීම, ආයතන/අංශ කිහිපයක සම්බන්ධතාවයෙන් පිළිතුරු ඉදිරිපත් කිරීමට සිදුවීම වැනි හේතු මත පිළිතුරු සැපයීම සඳහා කාල ප්‍රමාදයක් සිදුවූ අවස්ථා පැවතුණද විගණන විමසුම් කිහිපයකට හැර අනෙකුත් සියළුම විගණන විමසුම් සඳහා නියමිත කාලසීමාව තුළ පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතුකර ඇති අතර, ඉදිරියේදී නියමිත දිනට පිළිතුරු ඉදිරිපත් කිරීම වෙනුවෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග සිදුකර ඇත. අ. විගණන විමසුම් සඳහා ප්‍රමාදයකින් තොරව පිළිතුරු ඉදිරිපත් කිරීම සඬැදිව සෑම දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදීම සාකච්ඡා කිරීම හා ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ අදාළ අංශ ප්‍රධානීන් දැනුවත් කිරීම. ආ. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණයට යටත්වන ආයතනයන්හි මූල්‍ය කාර්යසාධනය ඇගයීමේදී හිමිවන ලකුණු ප්‍රමාණය ලබාගැනීම වෙනුවෙන් විගණන විමසුම් සඳහා නියමිත දිනට පිළිතුරු ඉදිරිපත් කරන ලෙස යුද්ධ හමුදාවේ සියළු ස්ථානයන් දැනුවත් කිරීමට කටයුතුකර ඇති අතර, එය කාලීනව අධීක්ෂණය කිරීම. ඇ. දිවයිනපුරා පිහිටි යුද්ධ හමුදා ආයතන වලින් විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා ගැනීමේදී එම කඳවුරු

	ස්ථාපිතවී ඇති ආකාරය අනුව තොරතුරු ඉදිරිපත් කිරීමේදී ප්‍රායෝගික හේතූන් මත යම් කාල ප්‍රමාදයක් සිදුවන අතර, එම කාල ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා ආයතන අතර සහසම්බන්ධතාවයෙන් යුතුව නිරන්තර අධීක්ෂණයෙන් යුතුව කටයුතු කිරීමට ක්‍රියාකර නියමිත දිනට පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම. ඈ. යුද්ධ හමුදා අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ මෙම විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම හා තොරතුරු ලබාදීමේ කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණය සඳහා වෙනම අංශයක් ස්ථාපනය කර පැවතීම. ඒ අනුව විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කිරීම ප්‍රමාදයකින් තොරව සිදු කිරීම පිණිස මේ වන විට ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, මෙම නිරීක්ෂණය අවම වන පරිදි ප්‍රමාදයකින් තොරව පිළිතුරු ඉදිරිපත් කිරීම සඳහා ආයතනික වශයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වමි.
3. සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	2022 වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 03 ක් පවත්වා ඇති අතර, 2023 වර්ෂයේ සිට නියමිත පරිදි සෑම කාර්තුවකටම අදාළ වන පරිදි විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතුකර ඇත.
4. සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	යුද්ධ හමුදාව සතුව ඇති වාහන අතුරින් ලියාපදිංචි සහතිකපත් නොමැති වාහන ලියාපදිංචි කිරීමේදී පවතින ගැටළු නිරාකරණයකර ගැනීම සඳහා අවැසි ඉදිරි කටයුතු මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව සහ ඊට අදාළ රාජ්‍ය ආයතන සමග සම්බන්ධතාවයෙන් යුතුව සිදුකරමින් පවතින අතර, එම ආයතනයන්හි රාජකාරි ස්වාභාවය හා කාර්ය බහුලත්වය මත මෙම ක්‍රියාවලියේ ප්‍රමාදයන් සිදුවී ඇත. ත්‍රස්තවාදීන්ගෙන් අත්අඩංගුවට ගත් වාහන නවතමයෙන් ලියාපදිංචි කිරීමට කැබිනට් මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ක්‍රියාකරමින් පවතින අතර, අදාළ අනුමැතිය ලැබීමෙන් පසු ලියාපදිංචි කිරීමේ ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.
5. සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරුකර නොතිබුණි.	යුද්ධ හමුදාව තුළ රාජකාරි යොදවා ඇති සියළුම යුද්ධ හමුදා වාහනවල “ARMY” සලකුණ සඳහන් කරමින් යුහ අංක සහිතව රාජකාරියේ යොදවා ඇති අතර, ඇතැම් හමුදා වාහන යුද්ධ හමුදාවට ආවේණික කොළ වර්ණයෙන් පින්තාරුකර ඇත.

6. වාහනයක් ගර්හිතවී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණයකර නොතිබුණි.	2022 වර්ෂයට අදාළව අයෝග්‍ය කරන ලද වාහන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත හා ශ්‍රී ලංකා රේගුව වෙතින් නිෂ්කාශණ ලබාගැනීමෙන් පසුව පමණක් යුද්ධ හමුදාව වෙතින් පවත්වනු ලබන ටෙන්ඩර් ක්‍රියාවලියක් මගින් අලෙවි කිරීමට කටයුතුකරන අතර, 2023 මැයි මස තුළ ටෙන්ඩර් ක්‍රියාවලියක් පවත්වා අයෝග්‍ය වාහන අලෙවි කිරීමට කටයුතුකර ඇත. වාහන ලියාපදිංචි සහතිකවල විශේෂ කොන්දේසි සටහන්ව තිබීම හේතුවෙන් ආනයන බදු මුදල් නිරවුල්කරන තෙක් අලෙවි කිරීම් සිදුකළ නොහැකි වාහන හා පරිත්‍යාග වශයෙන් යුද්ධ හමුදාවේ පරිහරණය සඳහා ලබාගෙන ඇති වෙනත් රාජ්‍ය ආයතන නමින් ලියාපදිංචි වී ඇති අයෝග්‍ය වාහන පමණක් 2023 වර්ෂයේ පැවති ටෙන්ඩර් ක්‍රියාවලිය මගින් අලෙවි කිරීමට නොහැකි වී ඇත. එම වාහනවල පවතින නිශ්කාශන ගැටළු නිරවුල් කරගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුව හා වාහනවල හිමිකාරීත්වය පවතින ආයතන සමඟ සම්බන්ධතාවයෙන් අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන ලද නමුත් අදාළ වාහන ආනයනය කිරීමට අදාළ ලිපිලේඛන ශ්‍රී ලංකා රේගුව වෙතින් ලබාගැනීමේදී ගැටළු හේතුවෙන් මෙම වාහන ටෙන්ඩර් ක්‍රියාවලිය මගින් අලෙවි කිරීම ප්‍රමාදවී ඇත. එක් ටෙන්ඩර් ක්‍රියාවලියක් සිදුකිරීම සඳහා පුවත්පත් දැන්වීම්, ඉන්ධන, ප්‍රවාහන හා ලිපිද්‍රව්‍ය සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුවීම හේතුවෙන් වර්ෂයකට එක් ටෙන්ඩර් ක්‍රියාවලියක් පමණක් සිදුකර ඇත. වර්තමානය වන විට ජාතික විගණන කාර්යාලය වෙතින් ලබාදී ඇති නිර්දේශ අනුව ඉදිරි ක්‍රියාමාර්ග සිදුකරනු ලැබේ.
7. රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතුකර නොතිබුණි.	2022 වර්ෂය තුළ රිය අනතුරු සිදුවීම් 24 කට අදාළව මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීම සඳහා ලිපිගොනු ආරම්භකර ඇති අතර, මේ වන විට රිය අනතුරු ලිපිගොනු 11 ක් සඳහා මුදල් රෙගුලාසි අනුව කටයුතුකර නිරවුල්කර ඇත. ඉතිරි රිය අනතුරු සිදුවීම් 13 සඳහා ද අදාළ මුදල් රෙගුලාසි අනුව කටයුතුකර ඇති අතර පහත සඳහන් කරුණු හේතුවෙන් නිරවුල් නොවී පවතී. (1)සිවිල් අධිකරණයෙහි නඩු පැවතීම. (2)වගකිවයුතු අයවළුන්ගෙන් මුදල් අයකරමින් පැවතීම. (3)මූලික පරීක්ෂණ උසාවි කටයුතුවල නිරීක්ෂණ පැවතීම.
8. බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළයුතුව තිබූ ශේෂ සබන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල්කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වන ගැලපුම් කළයුතු ශේෂ සම්බන්ධයෙන් මේ වනවිට අදාළ මුදල් රෙගුලාසි ප්‍රකාරව මසක් තුළ නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

9. මු.රෙ. 94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි.	වර්ෂය සඳහා ලබාදී ඇති ප්‍රතිපාදන සීමාව තුළ පමණක් වියදම් කළමනාකරණය කරගනිමින් අදාළ අවශ්‍යතාවයන් ඉටුකර ගන්නා මෙන් ප්‍රතිපත්ති හා ක්‍රියාකාරී පාලන නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇත.
10. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි	යුද්ධ හමුදාවේ නිලධාරීන්/සෙසුනිලයින් හා සිවිල් කාර්ය මණ්ඩලය ලබාගත් ණයවලින් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා සහ නැවත ඇති නොවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පහත පරිදි වේ. (1) **යුද්ධ හමුදා නිලධාරීන්/සෙසුනිලයින්ට අදාළ හිඟහිටි ණය ශේෂ අයකරගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග.** (i) මියගිය අයවළුන්ගේ ණය ශේෂයන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කිරීම. (ii) ණය ශේෂයන් විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කිරීම. (iii) ණය ශේෂයන් විශ්‍රාම වැටුපෙන් වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කිරීම. (iv) සේවය අතහැරගොස් ඇති අයවළුන්ට අදාළ ණය ශේෂයන් ඔවුන් සතු ඒකක ඉතිරි කිරීම්, නොගෙවූ හිඟ වැටුප් හා දීමනා හා යුද්ධ හමුදා යහසාධක ඉතිරි කිරීම් හී ශේෂ මගින් අයකරගැනීමට කටයුතු කිරීම. (v) අයකරගත නොහැකි වසර 05 ක් ඉක්මවූ ණය ශේෂ සම්බන්ධයෙන් PDF/RED/REG/CIR/2023/04 හා 2024.05.29 දිනැති 01/2024 රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් ලබාදී ඇති උපදෙස් අනුව කටයුතු කිරීම. (2) **යුද්ධ හමුදා නිලධාරීන්/සෙසුනිලයින්ට අදාළව හිඟ හිටි ණය ශේෂ ඇති නොවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග.** (i) ආපදා ණය ලබාදීමේදී සාමාජිකයන්ගේ විශ්‍රාම යන දිනය සැලකිල්ලට ගෙන කටයුතුකරන අතර, අවම වශයෙන් විශ්‍රාම යන දිනට වසර 03 ක ඉදිරි සේවා කාලයක් ඉතිරිව තිබෙදැයි පරීක්ෂා කිරීමෙන් අනතුරුව ණය ලබාදීමට කටයුතු කිරීම. (ii) අළුතින් එකතුවන අයකරගත නොහැකි ණය ශේෂයන් අයවීම නතරවීම සිදුවන පළමු මාසයේ සිටම

ඇපකරුවන් වෙතින් අයකරගැනීමට කටයුතු කිරීම හා ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට නොහැකි ණය ශේෂ හඳුනාගෙන එම ණය ශේෂයන් යහසාධකඅම/ඒකක ඉතිරි කිරීම් තැන්පතු ඇත්නම් එමගින් අයකර ගැනීමට කටයුතු කිරීම.

(iii) විශ්‍රාම ගන්නා අයවළුන්ගේ හිඟහිටි ණය ශේෂයන් පවතින විටදී එම ණය ශේෂයන් සම්පූර්ණයෙන් අවසන් වැටුප් හා දීමනා මගින් අයකර ඉතිරි ශේෂයක් වේ නම් එම ශේෂය විශ්‍රාම වැටුප් පාරිතොෂිකයෙන් හෝ විශ්‍රාම වැටුපෙන් අයකිරීමට කටයුතු කිරීම හා ඒ පිළිබඳ විශේෂ අවධානය යොමුකර එම මුදල් අයකරගන්නාතුරු අධීක්ෂණ කටයුතු සිදුකිරීම.

(3) **යුද්ධ හමුදා සිවිල් කාර්ය මණ්ඩලයට අදාළ හිඟහිටි ණය ශේෂ අයකරගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග.**

(i) විශ්‍රාම ගිය හා මියගිය නිලධාරීන්ට අදාළ විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීමට අවශ්‍ය ලිපිගොණු සම්පූර්ණකර කඩිනමින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතුකර එමගින් අයකර ගැනීම.

(ii) අවුරුදු 45 න් පසුව ස්ථීර පත්වීම් ලද සිවිල් සේවක මහතුන්ට විශ්‍රාම වැටුප් හිමිකම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතුකර එමගින් අයකර ගැනීම.

(iii) අයනොවී පවතින ණය ශේෂයන් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම.

(iv) සේවය හැරගිය අයවළුන්ගෙන් අයවීමට ඇති හිඟ ණය ඔවුන්ට අදාළ අතිකාල දීමනා/වැටුප් මගින් හා සිවිල් සේවක යහසාධක සංගමයේ තැන්පතු නිදහස් කිරීමේදී අයකර ගැනීමට කටයුතු කිරීම.

(v) අයකරගත නොහැකිව පවතින වර්ෂ 05 ඉක්මවූ රු. 25,000.00 ට අඩු හිඟ ණය ශේෂ PDF/RED/01/01/2020/01 හා 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ පරිදි කපාහැරීමේ මණ්ඩලයක අනුමැතිය සහිතව කපා හැරීමේ අනුමැතිය සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.

	(vi) අයකරගත නොහැකිව පවතින වර්ෂ 05 ඉක්මවූ රු. 25,000.00 ට වැඩි හිඟ ණය ශේෂ PDF/RED/REG/CIR/ 2023/04 හා 2024.05.29 දිනැති 01/2024 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ පරිදි කපා හැරීමේ මණ්ඩලයක අනුමැතිය සහිතව කපා හැරීමේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම. **(4) යුද්ධ හමුදා සිවිල් කාර්ය මණ්ඩලයට අදාළව හිඟහිටි ණය ශේෂ ඇති නොවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග.** (i) ආපදා ණය ඉල්ලුම් කිරීමේදී විශ්‍රාම යාමට ආසන්න නිලධාරීන්ගෙන් විශ්‍රාම ගන්වන දිනයට පෙර ණය මුදල අයකරගත හැකි පරිදි වාරික මුදල මූලික වැටුපෙන් 40% සීමාව තුළ වැඩි කිරීම හෝ ලබාදෙනු ලබන ණය මුදල අඩු කිරීමට පියවර ගෙන ඇත. (ii) විශේෂ හා උත්සව අත්තිකාරම් ලබාදීමේදී රජයේ ස්ථිර නිලධාරීන් දෙදෙනෙකු ඇපකරුවන් ලෙස ඇප සහතිකයක් ලබාගැනීමට කටයුතු කිරීම. (iii) විශ්‍රාම යාමට ආසන්න සිවිල් සේවකයින් වෙත ආපදා ණය ලබාදීමේදී විශ්‍රාම යන දිනය සැලකිල්ලට ගෙන අනිවාර්ය විශ්‍රාම යන දිනය දක්වා රාජකාරි කටයුතු සිදුකරන බවට ණයකරුගෙන් හා ඇපකරුගෙන් පොරොන්දු ප්‍රකාශයක් ලබාගැනීමට කටයුතු කිරීම. (iv) ආයතන සංග්‍රහයේ 23 පරිශිෂ්ටය පරිදි විශ්‍රාම වැටුප පරිවර්තනය කිරීමට මනාපය පලකිරීමේ ප්‍රකාශයක් ලබාගැනීමට කටයුතු කිරීම. (v) සේවකයෙකු විශ්‍රාම යාමට මාස 06 කට පෙර ඔහුගේ පුද්ගලික ලිපිගොණුව තුළ පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීම. (vi) ආපදා ණය ලබාදීමේදී යම් සිවිල් සේවකයෙක් ස්ථිර වී වසර 10 ක් ඉක්මවා නිබුණද, වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇති නම් ණය මුදල් ලබාගැනීමට ඉල්ලුම් කිරීමේදී සේවය ස්ථිරකර ඇති ඇපකරුවන් සමග ණය ගොනුව අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම. (vii) ස්ථිර වී වසර 10 ක් නොඉක්මවූ සිවිල් සේවකයින් සඳහා වැටුප් රහිත, නිවාඩු රහිත ඇපකරුවන් ලබාගැනීමට කටයුතු කිරීම හා වැටුප් රහිත නිවාඩු බහුලව ලබාගෙන ඇති සිවිල් සේවකයින් ඇපකරුවන් වශයෙන් පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම.

	දෙවන කොටස
1. ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසාදී නොතිබුණි.	යුද්ධ හමුදාව සතු නිල වෙබ් අඩවියේ ආරක්ෂාව සඳහා විවිධ තාක්ෂණික ක්‍රියාමාර්ග වත්මන් කාලයට ගැලෙපන පරිදි යොදාගෙන තිබෙන අතර ඒ අනුව යුද්ධ හමුදා වෙබ් අඩවිය සතු දත්ත පද්ධතිය (Data base) වෙත සෘජුවම බාහිර පාර්ශවයන් හට සම්බන්ධවීමේ අවකාශයන් සියල්ල සයිබර් ආරක්ෂණ පිළිවෙත් අනුව ඒ සඳහා වූ තාක්ෂණික උපදෙස් පරිදි වළක්වා ඇත. වෙබ් අඩවිය හා සමගාමී සමාජජාලා ගිණුම් (Whatsapp, Facebook, Twitter, Instragam, Tiktok , YouTube) හරහා මහජනතාවට පැමිණිලි හා ප්‍රශංසා කිරීමේ අවස්ථාව ලබාදී ඇත. එමඟින් අප වෙත ප්‍රශංසා හා පැමිණිලි ලැබෙන අතර එම සියල්ල වෙබ් අඩවිය හා සම්බන්ධකර (Link) ඇත. එබැවින් පරිශීලකයන්ට යුද්ධ හමුදා වෙබ් අඩවිය හරහා සමාජජාලා ගිණුම් ඔස්සේ තම ප්‍රතිචාරයන් දැක්විය හැකිය. තවද, යුද්ධ හමුදා වෙබ් අඩවියෙහි (www.army.lk) හි මෙනු තීරුවෙහි අප අමතන්න (Contact) යටතේ ලිපිනය, දුරකථන හා ෆැක්ස් අංක, විද්‍යුත් තැපැල් ලිපිනයන් සඳහන්කර ඇති අතර එමඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රසංශා කිරීමට අවස්ථාවක් සලසාදී ඇත.
2. 2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියලකර ක්‍රියාත්මක කර නොතිබුණි.	රාජ්‍ය ආයතනයක් වෙතින් සේවාවන් ලබන මහජනතාවට අවශ්‍යතාවයන් කඩිනම්ව, කාර්යක්ෂමව, ගුණාත්මකව හා අඛණ්ඩව ඉටුකරන බවට ලිඛිත බැඳීමක් ආකාරයෙන් සෑම රාජ්‍ය ආයතනයකම පුරවැසි -සේවාලාභී ප්‍රඥප්තියක් ස්ථාපිත කිරීම සම්බන්ධව 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය මගින් උපදෙස් ලබාදී ඇතත් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මහජනයාට සෘජුවම සේවා සැපයීම් සිදුකරන ආයතනයක් නොවන බැවින් මෙවැනි ප්‍රඥප්තියක් සකස්කර නොමැති අතර, මේ සබැඳිව අවශ්‍ය උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ.
3. ආයතනයේ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	
4. සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්යසාධන ගිවිසුම් සකස්කර ගිවිසුම්ගතව නොතිබුණි.	කාර්ය මණ්ඩලයේ සියළුම නිලධාරීන් හා සෙසුනිලයන්ට අදාළ වාර්ෂික රහස්‍ය වාර්තා (කාර්යසාධන වාර්තා) වාර්ෂිකව නිසි පරිදි සම්පූර්ණ කරනු ලැබේ.
5. ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව 2022 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කර ඇති වාර්තාවේ ඇති විගණකාධිපති මතය තත්ත්වා ගණනය කළ මතයක් වේ.

6. විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මකකර නොතිබුණි.	විගණකාධිපති වාර්තාවේ සඳහන් නිරීක්ෂණ සඳහා ලබාදී ඇති නිර්දේශ බොහෝමයක් ක්‍රියාත්මකකර ඇති අතර ඇතැම් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවැසි උපදෙස් නිකුත්කර ඇත.

ඩී.කේ.එච්. කෝලිත
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ

3. ශ්‍රී ලංකා නාවික හමුදාව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු / කමිටුව විසින් ලබාදෙන ලද මාර්ගෝපදේෂ	අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ආයතනය ගත් ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය
පළමු කොටස	
1. විගණකාධිපතිරවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	2022 වර්ෂය මූල්‍ය වර්ෂය තුල ඇති වූ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇතම් විගණන විමසුම් වෙනුවෙන් විවිධ නාවික විධානයන් වෙතින් පිළිතුරු ලබාගෙන ඉදිරිපත් කිරීමට තිබූ අවස්ථාවන්හිදී පිළිතුරු ලබා දීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය වූ අතර, මෙය මීට පෙර අවස්ථා වලදී නිරීක්ෂණය නොවූ කරුණකි. තවද, 2023 සහ 2024 මූල්‍ය වර්ෂ වලදී විගණන විමසුම් වලට පිළිතුරු ලබාදීම ප්‍රමාදවීම සම්බන්ධව විගණන විමසුම් හෝ තොරතුරු විමසීමක් ජාතික විගණන කාර්යාලය විසින් සිදුකර නොමැත.
2. මු.රෙ 134(2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙළ කර නොතිබුණි.	2022 වර්ෂයට අදාළ අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භය වන විට පිළියෙල කර අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුව වෙතින් අනුමැතිය ලබාගෙන තිබුණද, රට තුළ පැවති කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් විගණකාධිපති වෙතින් විමසීම් සිදුකර ගැනීමට නොහැකි වූ අතර 2023 වර්ෂයේ සිට ඒ සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගෙන කටයුතු කරමින් පවතී.
3. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිලිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාලවකවානු තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	2022 වර්ෂයේ නාවික හමුදා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට සමගාමීව අතිරික්තතා හෝ ඌනතා සම්බන්ධයෙන් හා අනෙකුත් නිර්දේශයන්ද නියමිත කාලවකවානුව තුල සිදුකර ඇත.
4. සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	නාවික හමුදාව වෙත වෙනත් දෙපාර්තමේන්තු සහ ආයතන වලින් පරිත්‍යාග වශයෙන් ලබා දී ඇති සියළුම රථ වාහන නාවික හමුදාධිපති නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අයිතිය පවරාගෙන ඇත. ආ. මෝටර් වාහන ආඥා පනතේ 2 වන වගන්තිය (මෝටර් වාහන ලියාපදිංචිය හෝ ඒ සම්බන්ධ ලේඛන) 1955 ජූලි මස 08 වන දිනැති අංක 10815 දරණ රජයේ ගැසට් පත්‍රය මඟින් ත්‍රිවිධ හමුදාව නිදහස් කර ඇති බැවින් නාවික හමුදාව වෙත යුධමය කාලසීමාවේදී ලබාගෙන ඇති රථ වාහනයන්ගී අයිතිය නාවික හමුදාව සතු වුවත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොමැත.

	ඇ. එම ලියාපදිංචි නොකල රථ වාහන මෝටර් ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමට නැවත උත්සහ ගන්නා ලෙස අතර, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් මෙම රථවාහන සඳහා MTA 2 පෝරමයේ පිටුපස සඳහන් ලිපිලේඛණ සමඟ ඉදිරිපත් කිරීමට උපදෙස් ලබාදෙන ලදී. එසේ ඉදිරිපත් කිරීමට අපොහොසත් නම් කොමිස්ට්‍රෝලර් ජෙනරාල් වෙත යොමු කිරීමට දන්වන ලදී. ඈ. මේ සම්බන්ධව කොමිස්ට්‍රෝලර් ජෙනරාල් වෙත යොමු කිරීමෙන් අනතුරුව එම දෙපාර්තමේන්තුවෙන්ද MTA 2 පෝරමයේ පිටුපස සඳහන් ලිපිලේඛන රේගු දෙපාර්තමේන්තුව වෙතින් ලබාගෙන අවශ්‍ය ඉදිරි කටයුතු කරන මෙන් උපදෙස් ලබාදෙන ලදී. ඉ. රේගු දෙපාර්තමේන්තුව වෙතින් ප්‍රායෝගික ලෙස එක් වාහනයක අදාළ MTA 2 පෝරමයේ පිටුපස සඳහන් ලිපිලේඛණ ඉල්ලා සිටි නමුත්, රේගු දත්ත පද්ධතිය වෙත වැසි අංක සඳහන් කිරීම 2004 වර්ෂයේදී ආරම්භ කර ඇති බවත් මෙම වාහන වල අදාළ වාහනය රේගුවෙන් නිදහස් කිරීමේදී නිකුත් කරන ලියකියවිලි වල තොරතුරු නොමැති බවත් සඳහන් කර ඇත. ඊ. එබැවින් නාවික හමුදාව සතු ප්‍රවාහන මෝටර් රථ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොකල වාහන සහ පසුගිය යුධ සමයේ නාවික හමුදාවට ලබා ගන්නා ලද රථ වාහන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කල නොහැකි බව නිරීක්ෂණය වේ. උ. කෙසේ නමුත් මෑත කාලයේ සිට අනෙකුත් සියළුම රථ වාහන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමට කටයුතු කර ඇත. ඌ. තවද, නාවික හමුදාවේ සියළුම වාහන (මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කල සහ නොකල රථ වාහන) සඳහා නාවික හමුදාවට ආවේනික කාණ්ඩ ක්‍රමයක් යටතේ නාම අංකයක් නිකුත් කර නාවික හමුදාව තුල ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී (ගබඩා පාලන) කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.
5. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	නාවික හමුදාවට අයත් 4000 කට ආසන්න වාහන වල දෛනික ධාවන සටහන් එම වාහන අදාළ නාවික හමුදාවට අයත් රට පුරා පවතින ආයතන (උදාහරණයක් ලෙස කන්කසන්තුරය, ත්‍රීකුණාමළය, පානම, මඩකලපුව සහ ඩෙල්ෆ් දූපත වැනි) ආයතන 53ක පවත්වා ගෙන යනු ලබන අතර, මාසික සාරාංශ වාර්තා අදාළ ආයතනය වෙතින් මාසිකව නාවික හමුදා මූලස්ථානය වෙත එවනු ලැබේ. එබැවින් මෙලෙස දිවයින පුරා පිහිටි නාවික හමුදා කඳවුරු

	වෙත අනුයුක්ත කර ඇති රථවාහන වල විශේෂයෙන්ම යාපනය අර්ධද්වීපයේ සහ අනෙකුත් දුරින් පිහිටි විධානයන් වෙතින් දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත යැවීම ප්‍රායෝගික නොවන අතර, අවශ්‍ය අවස්ථා වලදී විගණන කටයුතු සඳහා අභ්‍යන්තර සහ රජයේ විගණනයන් සඳහා ඉදිරිපත් කරනු ලැබේ. තවද, නාවික හමුදා මූලස්ථානය මඟින් නාවික නියෝග 0325 අනුව පැහැදිලිව අදාළ ආයතනයන්ට මෙම දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තා පවත්වාගෙන යාම සඳහා උපදෙස් ලබා දී ඇති අතර, නාවික හමුදා සියළුම වාහන වල මාසික වාර්තා අදාළ ආයතනය වෙතින් මාසිකව වෙබ් අඩවියක් මඟින් (trms.navy.lk) නාවික හමුදා මූලස්ථානය වෙත ගෙන්වා ගැනීමෙන් අනතුරුව පරීක්ෂාවට භාජනය කෙරේ.
6. සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	1955 ජූලි 08 වන දිනැති අංක 10815 දරණ ගැසට් පත්‍රය ප්‍රකාරව නාවික හමුදාවට අයත් සියළුම වාහන වල නාවික හමුදාවට ආවේනික අංකයන් යටතේ 'නාහ' ලෙස සෑම විටම ප්‍රදර්ශනය කර ඇත. ආ. නාවික හමුදාවේ වාහන 4000කට ආසන්න රථවාහන ප්‍රමාණයක් පවතින අතර, ඒ අතුරින් ට්‍රැක්ටර්, ට්‍රැක්ටර් ට්ලෙර් සහ කුලී පදනම මත ලබාගත් වාහන වල මෙම රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමේ හැකියාවක් නොමැත. ඇ. මෙම වාහන යොදා ගනිමින් රාජ්‍ය ආරක්ෂාව මෙන්ම නොයෙකුත් ආකාරයේ පැවරෙන විශේෂ රාජකාරීන් වන රහසිගත මෙහෙයුම් යනාදියද ඉටු කරනු ලබයි. එවන් අවස්ථා වලදී රාජකාරී ස්භාවය මත නාවික වාහන (රජයේ) නොවන ආකාරයෙන් සිවිල් ලියාපදිංචි අංක සහිතව යොදා ගන්නා අවස්ථා ඇත. උදාහරණයක් ලෙස මත්ද්‍රව්‍ය වැටලීම් සිදු කරන අවස්ථාවන් වලදී ඡාවාරම්කරුවන්ට නාවික හමුදා වාහනයක් ලෙස හඳුනා ගැනීමට නොහැකි වන පරිදි නාවික හමුදාධිපතිගේ අවසරය යටතේ සිවිල් ලියාපදිංචි අංක සහිතව රථවාහන යොදා ගැනීමට කටයුතු කරනු ලබයි. ඈ. ඒ අනුව නාවික හමුදා වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමෙන් පසු ධාවනය සඳහා යොදවා ගැනීමේදී නාවික හමුදාව වෙත පැවරී ඇති/ පැවරෙන රාජ්‍ය ආරක්ෂක මෙන්ම අනෙකුත් විශේෂ රාජකාරීන් ඉටු කිරීමේදී ගැටළුකාරී තත්වයන් පැනනැගී යයි. එබැවින් නාවික හමුදාව ආරම්භයේ සිටම නාවික වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට කටයුතු කර නොමැත.

<table>
<tr><td>7. වාහනයක් ගර්හිත වී මාස 8කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.</td><td>ගර්හිත වී සුදුස්සක් කිරීමට යෝජිත වාහන අදාළ ආයතන වෙතින් දින 14ක් ඇතුලත භාරදීමට කටයුතු කිරීමෙන් පසු මාස 08 කට අඩු කාලයක් තුලදී මේ වන විටඅපහරණය කටයුතු සිදු කරමින් පවතී.</td></tr>
<tr><td>8. මු.රෙ 94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂයේ අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබුණි.</td><td>2022 වර්ෂයේ රට තුල පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් ඇතිවූ හදිසි තත්ත්වයන් (දේශපාලනික අස්ථාවර භාවය, සිවිල් ක්‍රියාකාරී අරගල, ඉන්ධන හිඟය) හමුවේ නාවික හමුදා මෙහෙයුම් රාජකාරී ක්‍රමවත්ව පවත්වාගෙන යැම සඳහා අපේක්ෂිත මට්ටමට වඩා වියදම් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කිරීමට සිදුවීම මත වැය විෂයන්ගේ ප්‍රතිපාදන ඉක්මවා බැදීම් වලට එළඹ තිබුණද, 2022 වර්ෂය තුලදී එලෙස බැරකම්වලට එළඹී වැය විෂයයන් සඳහා ගෙවීමක් සිදුකර නොමැති බව 2022 දෙසැම්බර් මස 31 වන දිනට අදාළ භාණ්ඩාගර මුද්‍රිත පිටපත අනුව සනාථ වේ.

ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් වලක්වා ගැනීමට පියවර ගෙන ඇත.</td></tr>
<tr><td>9. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.</td><td>වසරකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂයන් අයවීමේ ප්‍රගතිය පහත පරිදි වේ.

<table>
<tr><th>විස්තරය</th><th>2022/12/31 දිනට ශේෂය (රු)</th><th>2023/12/31 දිනට ශේෂය (රු)</th><th>අයවීමේ ප්‍රගතිය</th></tr>
<tr><td>මියගිය නිලධාරීන්</td><td>376,275.00</td><td>296,373.00</td><td>79,902.00</td></tr>
<tr><td>විශ්‍රාම ගිය නිලධාරීන්</td><td>1,081,030.00</td><td>615,646.00</td><td>465,384.00</td></tr>
<tr><td>වැඩ තහනම් කල නිලධාරීන්</td><td>268,159.35</td><td>234,999.35</td><td>33,160.00</td></tr>
<tr><td>සේවය අතහැර ගිය නිලධාරීන්</td><td>2,528,071.23</td><td>2,383,560.48</td><td>144,510.75</td></tr>
</table></td></tr>
<tr><td>10 මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.</td><td>තත්කාර්යය අතුරු අග්‍රිමයන් අයදුම් කිරීමේදී සහ නිරවුල් කිරීමේදී විගණන විමසුම් මඟින් පෙන්වා දී ඇති විෂමතාවයන් වලක්වා ගැනීම සඳහා නාවික හමුදාධිපතිගේ අත්සනින් යුතු 2022 අප්‍රේල් මස 29 වන දිනැති අංක එන්එච්කිව්/බීඑල්/ සීඑන්බී/ සීඊපීටී/ එච්/ 13/2022 දරන ලිපිය නිකුත් කර ඇති අතර, එහි මේ සම්බන්ධව උපදෙස් ලබා දී ඇත. එමෙන්ම අග්‍රිමයන් නිකුත් කල දින සිට නිරවුල් කිරීම සිදුකරන තෙක් අධ්‍යක්ෂ නාවික අයවැය කාර්යාලය විසින් සිහිකැඳවීම් ලිපි හා සංඥා නිකුත් කරමින් එය නිරීක්ෂණය කරමින් පවතී.</td></tr>
</table>

11. මු.රෙ 371 හි වන සීමාව ඉක්මවා තත්කාර්යය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.	2023 වසරේ සිට අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන සීමාව නොඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිමය නිකුත් කිරීමට කටයුතු කරමින් පවතී.
	දෙවන කොටස
1. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	ශ්‍රී ලංකා නාවික හමුදාව 2022 වසරේ පුහුණුව සඳහා මුදල් අමාත්‍යාංශය වෙතින් මිලියන 771ක් ඉල්ලා ඇතත් වෙන්කර ඇත්තේ මිලියන 400 ක් පමණි. තවද, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් වෙන්කර තිබූ පුහුණු පුරප්පාඩු සහ සංචාරක සීමාවන් හේතුවෙන් නාවික පුද්ගලයින් විදේශ පුහුණුව සඳහා සහභාගී කරවීම 50% ක් පමණ අඩු විය. වාර්ෂික පුහුණු සැලැස්ම අනුව 2022 දේශීය පුහුණු (අභ්‍යන්තර) පාඨමාලා 376 ක් කාල සටහන්ගත කර ඇතත්, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් අනිවාර්ය පාඨමාලා (උසස් පාඨමාලා/ ශ්‍රී ලංකා නාවික හමුදාවට අවශ්‍ය පාඨමාලා) පමණක් පවත්වන ලදී. තවද, 2022 වර්ෂයේදී දේශීය පුහුණු (බාහිර) පාඨමාලා 366 ආරම්භ කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, වසර තුළ ආර්ථික අර්බුදය සහ දේශපාලන නොසන්සුන්තාව හේතුවෙන් සැලසුම් කර ඇති පාඨමාලා වලින් ආරම්භ කළ හැකිවූයේ 50%කට වඩා අඩු ප්‍රමාණයක් පමණි.
2. ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	2022 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණන කාර්යාලය විසින් තත්වාගණනය කරන ලද මතයක් ඉදිරිපත් කර ඇති අතර, 2023 වර්ෂය අවසානයේ ගිණුම් සකස් කිරීමේදී පෙන්වා දී ඇති වැරදි හා අඩුපාඩු මහඟරවාගෙන ගිණුම් ප්‍රකාශන පිලියෙළ කර ඇත.

වී.කේ.එච්. කෝලිත
ප්‍රධාන මූල්‍ය නිලධාරි
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ

4. ශ්‍රී ලංකා ගුවන් හමුදාව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු / කමිටුව විසින් ලබාදෙන ලද මාර්ගෝපදේෂ	අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ආයතනය ගත් ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය
පළමු කොටස	
1. සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැති වීම.	අයිතිය තහවුරු කර ගැනීමේ ලිපි ලේඛන ගුවන් හමුදා නාමාවලීන් තුළ නොමැති රථ වාහනයන්හි අයිතිය තහවුරු කරගැනීමේ ක්‍රමවේදයක් පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා මට්ටමේ පවතී.
2 සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබීම.	රාජ්‍ය ආයතනයන්හි රථ වාහන සඳහා රාජ්‍ය ලාංඡනය සහ ආයතනයේ නම සඳහන් කළද, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින ත්‍රිවිධ හමුදා වාහන මත රාජ්‍ය ලාංඡන සටහන් කිරීම සිදු නොකරයි.
3. වාහනයක් ගර්හිත වී මාස 08 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබීම.	වාහන අපහරණ කිරීමේ කටයුතු ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සැපයුම් අධ්‍යක්ෂක මණ්ඩලය මඟින් පරිපාලන අධ්‍යක්ෂක මණ්ඩලය, සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂක මණ්ඩලය, සැපයුම් හා නඩත්තු කිරීමේ ඩිපෝව හා ආරක්ෂක අමාත්‍යාංශය සමඟ අනුබද්ධව සිදු කරනු ලබන අතර, එම සමීක්ෂණ මණ්ඩල සඳහා අවශ්‍ය සාමාජිකයන් ලබා දීමේදී එයට අදාළ ආයතන දීර්ඝ කාලයක් ගතකිරීම, විවිධ අවශ්‍යතාවයන් නිසා සමීක්ෂණ මණ්ඩල සඳහා නම් කරන ලද සාමාජිකයන් වෙනස් කිරීම සහ ප්‍රසම්පාදන කටයුතු වලදී සැපයුම්කරුවන් ඉදිරිපත් කරනු ලබන ලිපි ලේඛණවල ඇති පරස්පරතාවන් නිවැරදි කිරීමට සැලකිය යුතු කාලයක් ගත වීම වැනි කරුණු අපහරණ ක්‍රියාවලියේ කාල ප්‍රමාදයන් සිදුවීමට හේතු වී ඇත. තවද, වාහන අපහරණය කිරීමේදී ගර්හිත වන එක් එක් වාහනය වෙනුවෙන් වෙන වෙනම සමීක්ෂණ මණ්ඩල පත් කිරීම ප්‍රයෝගික කටයුත්තක් නොවන බැවින් සහ ඒ වෙනුවෙන් සැලකිය යුතු මුදලක් පරිපාලන වියදම් ලෙස දැරීමට සිදු වන බැවින් සැලකිය යුතු වාහන ප්‍රමාණයක් එකතු වූ පසු ඒ වෙනුවෙන් සමීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම ගුවන් හමුදාව තුළ සාමාන්‍යයෙන් සිදු කරනු ලබයි. එම නිසා ගර්හිත වාහන සැලකිය යුතු ප්‍රමාණයක් එකතු වීමට යම් කාලයක් ගත වේ. තවද, ගර්හිත වාහන අපහරණය කිරීමේදී ප්‍රසිද්ධ ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් එම කටයුතු සිදු කිරීමත් එමඟින්

	අනුමත වන ගැණුම්කරුවන් විසින් නියමිත කාලය තුළ මුදල් ගෙවා වාහන රැගෙන නොයාමත් හේතුවෙන් අපහරණය කිරීමේ කටයුතු නිම කිරීමට සැලකිය යුතු කාලයක් ගත වේ. ඉදිරියේදී එම කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් අදාළ අංශ වෙත ලබා දී ඇති අතර (විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම මඟින්) ඒ අනුව කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ.
4. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම.	<u>සේවා අංශය</u> වර්ෂයකට වඩා වැඩි කාලයක සිට අත්තිකාරම් 'බී' ගිණුමට ලැබිය යුතු හිඟ ණය ශේෂයන්හි (සේවා අංශයේ) එකතුව 2024.06.30 දිනට රු.171,763.34 වන අතර, මියගිය නිලධාරීන්ගේ හිඟ ණය ශේෂ එම සේවා පුද්ගලයින්ගේ අවසන් වැටුප මඟින් හෝ විශ්‍රාම වැටුප් පාරිතෝෂිතය මඟින් අයකර ගැනීමට කටයුතු කරන අතර, සේවය හැර ගිය නිලධාරීන්ගේ ඇපකරුවනුත් සේවය හැර ගොස් ඇති බැවින් අදාළ ණයකරු හෝ ඇපකරු සේවයට වාර්තා කළ පසු අදාළ හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරනු ලබන අතර සේවය අත්හිටවූ නිලධාරීන්ගේ හිඟ ණය ශේෂ වැන්දඹු හා අනත්දරු අරමුදල මඟින් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂවල (සේවා අංශයේ) වර්තමාන තත්ත්වය පහත පරිදි වේ.

විස්තරය	2022.12.31 දිනට ශේෂය (රු)	2024.06.30 දිනට ශේෂය (රු)
මියගිය නිලධාරීන්ගේ ණය ශේෂය	31,700.00	2,500.00
විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් ලැබිය යුතු ණය ශේෂය	285,779.22	-
සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් ලැබිය යුතු ණය ශේෂය	301,028.00	47,850.00
සේවය අත්හිටවූ නිලධාරීන්ගෙන් ලැබිය යුතු ණය ශේෂය	153,500.00	121,413.34
එකතුව	**772,007.22**	**171,763.34**

(අ) <u>**මියගිය නිලධාරීන්ගෙන් අය විය යුතු හිඟ හිටි ණය ශේෂය**</u>

2022.12.31 දින වන විට වර්ෂ 1 ට වැඩි මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.529,132.50 ක හිඟ ණය ශේෂය 2024.06.30 දින වන විට රු.166,139.83 ක් දක්වා අඩු වී ඇත. මෙම හිඟ ණය ශේෂයන් තුළ ඇතුළත්ව ඇති බොහෝමයක් ණය ශේෂයන් මරණ පාරිතෝෂිතය ප්‍රමාණවත් නොවීම නිසා අය නොවී ඉතිරිව පවතින ශේෂයන් වන අතර, අනෙකුත් හිඟ ණය ශේෂයන් තොරතුරු නොමැති වීම හේතුවෙන් අය නොවී පවතින ණය ශේෂයන් වේ. මෙසේ දීර්ඝ කාලයක් තිස්සේ අය නොවී රජයේ

	නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුමේ ඉදිරියට ගෙන ආ රු.59,042.50 ක මෙම හිඟ ණය ශේෂයන් රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 ප්‍රකාරව අත්හැර දැමීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. (ආ) <u>විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අය විය යුතු හිඟ හිටි ණය ශේෂය</u> 2022.12.31 දින වන විට පවතින වර්ෂ 1ට වැඩි විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය වන රු.1,637,269.52 ශේෂය 2024.06.30 දින වන විට රු.98,411.52 ක් දක්වා අඩුකර ඇත. එසේම දීර්ඝ කාලයක් තිස්සේ අයනොවී රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුමේ ඉදිරියට ගෙන ආ රු.13,446.52 ක මෙම හිඟ ණය ශේෂයන් රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 ප්‍රකාරව අත්හැර දැමීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. ඇ) <u>සේවය හැරගිය නිලධාරීන්ගෙන් අය විය යුතු හිඟ හිටි ණය ශේෂ</u> 2022.12.31 දින වන විට පවතින වර්ෂ 1ට වැඩි සේවය හැරගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය වන රු.8,513,778.48 ක ශේෂය 2024.06.30 දින වන විට රු.7,550,530.05 ක් දක්වා අඩු කර ඇත. තවද, 1990.01.01 සිට 2018.12.31 කාල පරිච්ඡේදයට අදාළව රු.25,000 ට අඩු රාජ්‍ය මුදල් 01/2020 චක්‍රලේඛ අනුව කටයුතු කර අවසන් වූ ණය ශේෂයන් රාජ්‍ය ආදායමින් අත්හැර දැමීම සඳහා 2024.02.13 දින කමිටුවක් පත්කර ඇත. කමිටු නිර්දේශ අනුව රු.455,126.69 ක හිඟ ණය ශේෂයන් කපා හැරීම සඳහා අනුමැතිය ලැබී ඇත. එසේම රාජ්‍ය මුදල් 01/2024 චක්‍රලේඛ අනුව රු.100,000 ට අඩු හිඟ ණය ශේෂ රාජ්‍ය ආදායමින් අත්හැර දැමීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
5. රැස්කළ ආදායම් අදාළ විධිවිධාන වලට අනුකූලව ආපසු ගෙවා නොතිබීම, රැස්කළ තිබුණු ආදායම්, සෘජුවම ආදායමට බැර කර හෝ ඒවා තැම්පත් ගිණුමේ රඳවාගෙන මාසයකට වඩා අඩු කාලයක් ඇතුළත ආදායම් ගිණුමට බැර කර හෝ නොතිබීම.	රැස් කළ ආදායම් සියල්ල රෙගුලාසි වලට අනුකූලව තැන්පත් ගිණුමට බැර නොකර රජයේ ආදායම් ගිණුමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ.
දෙවන කොටස	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ පැවතීම.	

2022 විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ යටත්ව මතයට (Qualified) අදාළ විගණන ඡේද පහත පරිදි වේ. අ. <u>මූලධන වියදම්</u> මු.රෙ.66/69 මාරු කිරීම් යටතේ පාකිස්ථාන ණය යෝජනා ක්‍රමය යටතේ යුධ ටැංකි (APC-15) මිලදී ගැනීමට ලද ප්‍රතිපාදන වලින් රු.15,795,903 ක් ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ රේඩාර් පද්ධතියට අමතර කොටස් මිලදී ගැනීම සඳහා යොදාගෙන තිබුණි.	ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ රේඩාර් පද්ධතියට අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීම වෙනුවෙන් අදාළ බිල්පත් පියවීම සඳහා පාකිස්ථාන ණය යෝජනා ක්‍රමය යටතේ යුධ ටැංකි)APC-15) මිලදී ගැනීමට වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් රු.15,795,903.00 ක් ආරක්ෂක අමාත්‍යාංශයේ සහ මුදල් අමාත්‍යාංශයේ) Authority number -2240000-2022BCUV-(00000004අනුමැතීන් මත මු රෙ.66 මඟින් ප්‍රතිපාදන මාරුකර ගෙවීම් සිදු කර ඇත.
ආ. <u>අත්තිකාරම් ගෙවීම්</u> ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වගන්තියේ සඳහන් පරිදි රජයේ නිලධාරීන්ට අත්තිකාරම් 'බී' ගිණුමට අදාළ ණය මුදල් ගෙවා අවසන් කිරීමට පෙර විශ්‍රාම ගිය/ මියගිය/ සේවය හැරගිය නිලධාරීන්ගේ අත්තිකාරම් ණය ශේෂ අයකර ගත නොහැකි අවස්ථා වලදී ඇපකරුවන්ගේ හෝ උරුමක්කාරයින්ගෙන් හෝ අයකර ගැනීමට කටයුතු කළ යුතු වූවත්, එම නියමයන්ගෙන් බැහැරව නිලධාරීන් 207 කගේ වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිටි ණය ශේෂය රු.8,267,831 ක් විය.	(අ) <u>මිය ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ හිටි ණය ශේෂය</u> 2022.12.31 දින වන විට පැවති වර්ෂ 05ට වැඩි මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.311,077.50 ක ශේෂය 2024.06.30 දින වන විට රු.88,424.50 දක්වා අඩු කරගෙන ඇත. 2024.06.30 දින වන විට ඉතිරි වී පවතින හිඟ ණය ශේෂයන් වර්ෂ 12 ඉක්ම වූ හිඟ ණය ශේෂයන් වන අතර, හිඟ ණය ශේෂය ඇති වීමත් සමඟ සුදුසු ක්‍රියාමාර්ග නොගැනීම නිසා (ඇපකරුවන්ගෙන් හෝ උරුමකරුවන්ගෙන් අයකර ගැනීම් සිදුකර නොගැනීම) දීර්ඝ කාලයක් තිස්සේ මේ දක්වා ගිණුම තුළ අඛණ්ඩව ඉදිරියට ගෙන ආ ශේෂයන් වේ. මෙම මියගිය නිලධාරීන්ට අදාළ හිඟ ණය ශේෂය අයකර ගැනීම සඳහා පසුගිය කාල සීමාව තුළ සිවිල් පරිපාලන අධ්‍යක්ෂක කාර්යාලයේ පැවති පුද්ගලික ලිපිගොනු පරීක්ෂා කිරීමෙන් ඔවුන්ගේ ලිපිනයන්ට සහ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් වෙත ලිපි යැවීම් සිදු කළද එම ලිපි සඳහාද ප්‍රතිචාරයක් ලැබී නොමැත. රාජ්‍ය මුදල් චක්‍රලේඛය 01/2020 අනුවද විශ්‍රාම හා මියගිය නිලධාරීන්ට අදාළ අය නොවන හිඟ ණය ශේෂයන් කපා හැරීම සඳහා ඉඩ ලබා දී නොමැති බැවින් අයකර ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගත නොහැකි මෙම ණය ශේෂයන් තව දුරටත් ගිණුමේ ඉදිරියට ගෙන යාම පමණක් සිදු කරමින් පවතී. (ආ) <u>විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අය විය යුතු ණය ශේෂය</u> 2022.12.31 දිනට රු.291,569.52 ක් වූ වර්ෂ 5 ට වැඩි විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.98,411.52 දක්වා අඩුකර ගෙන ඇත. 2024.06.30 වන විට ඉතිරි වී පවතින

	රු.98,411.52 ක ශේෂයන් රු.46,772.00 ක් විශ්‍රාමික නිලධාරීන් දෙදෙනෙකුට අයත් ණය ශේෂයන් වාරික වශයෙන් අය වීම සිදු වේ. අනෙකුත් ශේෂයන් සියල්ල වර්ෂ 10 ට වැඩි ණය ශේෂයන් වන අතර, සිවිල් පරිපාලන අධ්‍යක්ෂක කාර්යාලයේ පවතින පුද්ගලික ලිපිගොනු පරීක්ෂා කිරීමෙන් පසු ලබාගත් ලිපිනයන්ට ලිපි යැවීම මෙන්ම අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට ලිපි යැවීම සිදුකර ඇත. එමෙන්ම රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 අනුව ද මෙම හිඟ ණය ශේෂයන් කපා හැරීම සඳහා ඉඩ ලබා දී නොමැති බැවින් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගත නොහැකිව දීර්ඝ කාලයක් තිස්සේ ගිණුමේ අඛණ්ඩව ඉදිරියට ගෙන යාම පමණක් සිදු කරමින් පවතී. (ඇ) <u>සේවය හැරගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ හිටි ණය ශේෂය</u> 2022.12.31 දිනට රු.8,112,424.48 ක්ව පැවති වර්ෂ 5ට වැඩි සේවය හැරගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂය 2024.06.30 දින වන විට රු.7,173,821.46 ක් දක්වා අඩු කරගෙන ඇත. තවද, 1990.01.01 සිට 2018.12.31 කාල පරිච්ඡේදයට අදාළව රු.25,000.00 ට අඩු රාජ්‍ය මුදල් 01/2020 චක්‍රලේඛ අනුව කටයුතු කර අවසන් වූ ණය ශේෂයන් රාජ්‍ය ආදායමින් අත්හැර දැමීම සඳහා 2024.02.13 දින කමිටුවක් පත්කර ඇත. කමිටු නිර්දේශය අනුව රු.455,126.69 ක හිඟ ණය ශේෂයක් කපා හැරීම සඳහා අනුමැතිය ලැබී ඇත. එසේම රාජ්‍ය මුදල් 01/2024 චක්‍රලේඛ අනුව රු.100,000.00 ට අඩු හිඟ ණය ශේෂ රාජ්‍ය ආදායමින් අත්හැර දැමීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
ඇ. <u>මූල්‍ය නොවන වත්කම්</u> මු.රෙ. 109 යටතේ ගුවන් යානා 03 ක අලාභානි කපා හැරීමට අනුමත වටිනාකම රු.453,434,468 ක් වුවත් කපා හරින ලද වටිනාකම රු.368,179,200 ක්වූ බැවින් රු.85,255,268 කින් අඩුවෙන් කපා හැර තිබුණි. එසේම තවත් ගුවන්යානාවක හානි පාඩු යටතේ කපා හැරීමට අනුමත වටිනාකම රු.132,614,647 ක් වුවද කපා හරින ලද වටිනාකම රු.147,387,349 ක් වූ බැවින් රු.14,772,702 ක් වැඩියෙන් කපාහැර තිබුණි.	මෙම ගුවන්යානා හතරට (4) අදාළව මූල්‍ය නොවන වත්කම් වලින් කපාහැර ඇත්තේ ගුවන් යානා හතරෙහි (4) මුල් පිරිවැය වේ. කපා හැරීම සඳහා ඉදිරිපත් කර ඇති මු.රෙ 109 ආකෘති පත්‍ර (4) හිම මුල්පිරිවැය යටතේ දක්වා ඇත්තේ අලාභය වූ අවස්ථාවේ සිදුකළ ඇස්තමේන්තු පිරිවැය වේ. මෙම ගැටළුව පැන නැඟී ඇත්තේ අලාභානි ගණනය කරන අවස්ථාවේදී මාර්ගගත පරිගණක (CIGAS) පද්ධතියේ ඇති වටිනාකම පරීක්ෂා කිරීමට ඉදිරිපත් නොවීම මතයි. නමුත් මේවන විට අලාභානි ගණනයේදී මාර්ගගත (CIGAS) පරිගණක පද්ධතියේ ඇති වටිනාකම මත පදනම්ව අලාභානි ගණනය කිරීම සඳහා කටයුතු යොදා ඇති බැවින් ඉදිරියේදී මෙවැනි දෝෂ ඇති නොවේ.

ඩී.කේ.එච්. කෝලිත
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ

5. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

කම්ටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු / කම්ටුව විසින් ලබාදෙන ලද මාර්ගෝපදේෂ	අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ආයතනය ගත් ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය
පළමු කොටස	
1. පුද්ගල පඩිනඩි ලේඛණය/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සාමාජිකයින් 31,000 කට ආසන්න පිරිසකගේ වැටුප් සකස් කරනු ලබන්නේ සීමිත ලිපිකරුවන් පිරිසක් වන අතර පුද්ගල පඩිනඩි ලේඛණය සහ කාඩ්පත් නඩත්තු කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබුවද එය ප්‍රායෝගිකව සිදුකිරීම අපහසු බැවින් ඒ සඳහා විකල්පයක් ලෙස වැටුප් ගෙවනු ලබන පුද්ගලයන්ගේ තොරතුරු පරිඝණක ගත කර ඇති අතර, වර්ෂ අවසානයේ එක් එක් සාමාජිකයා වෙනුවෙන් වෙන වෙනම මාස 12 ට අදාලව, IPR Report ලබාගෙන, වැටුප් ලේඛනයක් නඩත්තු කරනු ලබන බව දන්වමි.
2. හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	මේ වන විට යාවත්කාලීනව හානි පිළිබඳ ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.
3. අවදානම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	2022 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම සඳහා අවදානම් ලේඛණය යා කර ඉදිරිපත් කර ඇති අතර, සෑම මුදල් වර්ෂයක් ආරම්භයේදීම, පවතින අවධානම් ඇගයීම් කර අවධානම් ලේඛණය යාවත්කාලීනව සකස්කිරීම සිදුකරන බව දන්වා සිටිමි.
4. සාමාජික ණය ලේඛණය (CC 10) යාවත්කාලීනව පවත්වා නැත.	ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැති බැවින් සාමාජික ණය ලේඛණය (CC 10) හස්ත ක්‍රමයට පවත්වාගෙනයාම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබුවද එය ප්‍රායෝගිකව සිදුකිරීම අපහසු බැවින් ඒ සඳහා විකල්පයක් ලෙස එම CC 10 ආකෘතිය පදනම් කරගෙන් ණය හා අත්තිකාරම් ලේඛණය පරිගණකය ආශ්‍රයෙන් පිළියෙල කර පවත්වාගෙන යාමට කටයුතු කර ඇති බව දන්වමි.
5. මු.රෙ 134 (3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂයේ රටේ පැවති අර්බුධකාරී වාතාවරණය හේතුවෙන් අභ්‍යන්තර විගණන විමසුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම ප්‍රමාද වී ඇත. වර්තමානය වන විට විගණන විමසුම් වල මෘදු පිටපත් විද්‍යුත් තැපැල හරහා ඉදිරිපත් කිරීම සඳහා වැඩ පිළිවෙලක් විගණන අධිකාරී සමඟ සාකච්ඡා සිදුකර ඇත.

6. 2017.06.26 දිනැති අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදයේ ප්‍රකාරව 2018 වර්ෂයේ දී මිල දී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳව තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023 වර්ෂයේ සිට අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදයේ ප්‍රකාරව ක්‍රියාකර ඇති බව දන්වමි.
7. 2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු.රෙ.756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ලබා දීමේ දී ඒකක කීපයකට අදාළව ප්‍රමාදවීමක් සිදු වී ඇති නමුත් 2023 වර්ෂයේ සිට සමීක්ෂණ වාර්තා නියමිත දිනට විගණකාධිපති වෙත යොමු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව දන්වා සිටිමි.
8. සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	වර්තමානය වන විට අයිතිය තහවුරු කරන ලිපි නොමැති වාහන සංඛ්‍යාව වාහන 32 කි. ඒ අනුව වෙනත් රාජ්‍ය ආයතන වෙතින් වාහන 20 ක් පවරා ගැනීම සඳහා අවශ්‍ය කරනු ලබන ලිපි ලේඛණ අදාළ ආයතන වෙත ඉදිරිපත් කර පැවරීම් කටයුතු සිදුකරමින් පවතී. ඉතිරි වාහන 12 සම්බන්ධයෙන් කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙතින් පවරා ගැනීම සඳහා උපදෙස් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.
9. සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	වාහන 03 ක රාජ්‍ය ලාංඡනය මේවන විට යොදා ඇත. තවත් වාහන 12 ක රාජ්‍ය ලාංඡන යෙදීමට මේ වන විට කටයුතු සූදානම් කර ඇති ඇත. ඉතිරි වාහන සඳහා ද රාජ්‍ය ලාංඡනය යෙදීමට කටයුතු කරන බව දන්වා සිටිමි.
10. වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ වාහන බොහෝ ප්‍රමාණයක් අධිකරණය විසින් රාජසන්තක කරන ලද වාහන හා වෙනත් දෙපාර්තමේන්තු මඟින් අපහරණය කර ලබාදෙන ලද වාහන වන බැවින්, අපහරණ ක්‍රියාවලියේ දී නිරවුල් කිරීම් සඳහා කාලසීමාවක් ගත වී ඇති බව දන්වා සිටිමි. නමුත් 2024 වර්ෂයේ සිට චක්‍රලේඛ අනුව අදාළ කාලසීමාව තුල කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව දන්වා

	සිටිමි. මේ වන විට 2022 වර්ෂයට අදාළ තක්සේරු වාර්තාව අනුව, මිල ගණන් කැඳවා, වාහන විකිණීමට කටයුතු කර ඇති අතර, මෙම වර්ෂය තුල අපහරණය කළයුතු වාහන හඳුනාගැනීම සඳහා මණ්ඩල පත් කර ඇති බවද දන්වා සිටිමි.
11. බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් ප්‍රමාද ඇති වූ අවස්ථා පැවති අතර, වර්තමානය වන විට මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව දන්වා සිටිමි.
12. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වර්ෂයකට වඩා වැඩිකාලයක් හිඟ හිටි ණයශේෂ සම්බන්ධව පහත පරිදි ක්‍රියාකරමින් පවතින බව දන්වා සිටිමි. මිය ගිය නිළධාරීන් ගෙන් අයවිය යුතු ණය ශේෂ මරණ පාරිතෝෂිකයෙන් අයකිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර, මේ වන විට කේවල ණය ශේෂ 11 නිරවුල් වී ඇත. විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර, කේවල ණය ශේෂ 06 ක් මේ වන විට නිරවුල් වී ඇත. සේවය අතහැර ගිය නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිනයන්ට එන්තරවාසි යැවීම, ඇපකරුවන් වෙත එන්තරවාසි යැවීම සහ සේවය අතහැරගිය සාමාජිකයන්ගේ යහසාධක අරමුදල් වලින් හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීම යන පියවරයන් මේ සම්බන්ධයෙන් ගෙන ඇත. මේ වන විට සේවය අතහැර ගිය නිලධාරීන්ගේ 11 දෙනෙකුගේ හිඟ හිටි කේවල ණය ශේෂ අයකරගෙන ඇත. මීට අමතරව නැවත සේවයේ පිහිට වූ 28 දෙනෙකු ගේ හිඟ ණය ශේෂ මේ වන විට අයකර ගනිමින් පවතින බව දන්වා සිටිමි.
13. මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	මු.රෙ.371 ප්‍රකාරව වර්තමානයේ ලබාදෙන තත්කාර්ය අතුරු අග්‍රිම, කාර්යය නිමවී වැඩ කරන දින 10 ක් ඇතුළත පියවීම් සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වමි.

දෙවන කොටස	
1. 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව සිවිල් කාර්යය මණ්ඩලය සඳහා 2024 වර්ෂය වෙනුවෙන් මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර ඇත. 31,000 ආසන්න සිවිල් ආරක්ෂක කාර්යය මණ්ඩලයක් සිටින බැවින් 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන හා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන තත්ත්වය සැලකිල්ලට ගෙන 2025 වර්ෂය වෙනුවෙන් මානව සම්පත් සැලැස්මක් පිළියෙල කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. මේ වන විට 2024 වර්ෂය වෙනුවෙන් ධාරිතා සංවර්ධන සැලැස්මක් පිළියෙල ඇති බවද වැඩිදුරටත් දන්වා සිටිමි.
2. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්යය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නො අඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	සෑම බදාදා දිනකම දෙපාර්තමේන්තුවේ සම්පත්දායකයින් සහ බාහිර සම්පත්දායකයින් හරහා බලකා මට්ටමින් සිවිල් ආරක්ෂක සාමාජික සාමාජිකාවන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීමට කටයුතු කර ඇත. වර්තමානය වන විට ඒ සඳහා බදාදා දිනය පුහුණු දිනයක් ලෙස නම් කර ඇත. මීට අමතරව පුහුණු සැලැස්මේ හඳුනාගත් පුහුණු අවස්ථා සිවිල් ආරක්ෂක සාමාජික සාමාජිකාවන් සඳහා ලබාදීම සිදුවන බව දන්වමි.
3. ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	ගිණුම් පිළිබඳ විගණන මතය තත්වාගණනය කළ මතයක් වන අතර, පෙර වර්ෂවල සිදුවී ඇති අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය අභ්‍යන්තර පාලනයන් ස්ථාපනය කර ඇති බව දන්වා සිටිමි.

ඩී.කේ.ඒච්. කෝලිත
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ

6. ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

කම්ටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු / කම්ටුව විසින් ලබාදෙන ලද මාර්ගෝපදේෂ	අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ආයතනය ගත් ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය
පළමු කොටස	
1. පුද්ගල පඩිනඩි ලේඛනය/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතින් ද්වීතීක පදනම මත කාර්ය මණ්ඩල අනුයුක්ත කර ඇති බැවින්, ඔවුනගේ මාසික වේතනය ශ්‍රී ලංකා නාවික හමුදාව වෙතින් ගෙවීම් කරනු ලබයි. එබැවින් මෙම දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි ලේඛනය/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කිරීමක් සිදු නොකරනු ලබයි.
2. සමාලෝචිත වර්ෂය තුල විගණන හා කළමනාකරණ කම්ටු රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි.	2022 වර්ෂයේ රට තුල පැවති කොවිඩ්-19 වසංගත තත්ත්වය සහ රට තුල පැවති අරගලකාරී තත්ත්වයන් හේතුවෙන් විගණන කළමනාකරණ කම්ටු රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. තවද, 2023 වර්ෂයේ පළමු, දෙවන, තුන්වන සහ සිව්වන කාර්තුවට අදාළ විගණන හා කළමනාකරණ කම්ටු රැස්වීම් පවත්වන ලදි.
3. 2017.06.26 වන දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජෙනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව තුල 2023 වර්ෂය වන තෙක් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන ගොස් නොමැති අතර, 2023 ජනවාරි මස 01 වන දින සිට ස්ථාවර වත්කම් ලේඛණයක් සකස් කර මේ වන තෙක් යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් ඇත. තවද, 2024 අගෝස්තු මස 06 වන දිනැති අංක ඩිජිසිජි/එල්ඕජි/12 දරන ලිපිය මඟින් 2023 වර්ෂයට අදාළ ස්ථාවර වත්කම් ලේඛණය කෝම්ප්ට්‍රෝලර් ජෙනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
4. 2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු	ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව තුල 2023 වර්ෂය වන තෙක් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන ගොස් නොමැති බැවින්, ඉහත සඳහන් චක්‍රලේඛය ප්‍රකාරව විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකුද පත්කර නොමැති අතර, 2024 ජනවාරි මස 16 වන දිනැති අංක

නිලධාරියෙකු පත්කර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා නොතිබුණි.	ඩිජීසිජී/එල්ඕජී/10 දරන ලිපිය මඟින් ලුතිනන් කොමාණ්ඩර් (සැ) ඩිඑම්එච් ද සිල්වා නිලධාරියා පත්කර කොම්ප්ට්‍රෝලර් ජෙනරාල් කාර්යාලය වෙත දැනුම් දීමට කටයුතු කර ඇත.
5. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම.	ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවෙහි පවතින වාහන සඳහා දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තා මේ වන තෙක් නිසියාකාරව පටිපාටිගෙන යන අතර, රටෙහි පවතින ලිපි ද්‍රව්‍ය හිගතාවය හේතුවෙන් අමතර පිටපත් මුද්‍රණය කිරීමක් සිදු නොකරනු ලබයි. එහෙත් අදාළ දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තාවන් අවශ්‍ය වුවහොත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බැව් දැන්වේ.
6. ආයතනයට ලැබී තිබුණු විදේශාධාර සම්බන්ධයෙන් 1994.04.20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි	ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට පරිත්‍යාග වශයෙන් ලද මුල්‍ය නොවන වත්කම් CIGAS වැඩසටහනට ඇතුලත් කර ජ'නල් සටහනක් මඟින් ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය වෙතින් මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
දෙවන කොටස	
1. ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි.	ශ්‍රී ලංකාවට අයත් වෙරළබඩ ප්‍රදේශ සහ දේශීය ජල තීරය ඇතුළු සමුද්‍රීය කලාපවල සහ මුහුදේ ආරක්ෂාව තහවුරු කිරීම මෙම දෙපාර්තමේන්තුවේ තිරසාර අරමුණ වන අතර, එය පහත විෂය පථයන් ඔස්සේ විදහා දැක්විය හැකිය. අ. ශ්‍රී ලංකා මුහුදු කලාපයන්හි නීති විරෝධී මසුන් ඇල්ලීම වැලැක්වීම සහ මුහුදේදී සහය ලබාදීමද ඇතුළුව ධීවරයින් ආරක්ෂා කිරීම. ආ. නීති විරෝධී භාණ්ඩ ජාවාරම් කිරීමට එරෙහිව සහ ආගමනයට එරෙහිව කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව සහ අදාළ ආයතනයන්ට අවශ්‍ය සහයෝගය ලබා දීම. ඇ. මුහුදේ සිදුවන මුහුදු මංකොල්ලකෑම් වැළැක්වීම හෝ කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම. ඈ. සමුද්‍රීය කලාපය තුල සහ ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයෙහි සිදුවන ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් මර්ධනය කිරීමේ අරමුණෙන් නීතිය බලාත්මක කිරීමේ ආයතන සහ සන්නද්ධ හමුදාවන් සමග සහයෝගීව කටයුතු කිරීම. ඉ. ශ්‍රී ලංකා මුහුදු සීමාවෙන් පිට සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරම් කටයුතු වැළැක්වීම.

	ඊ. මුදුදේදී ජීවිත හා දේපල වන සුරක්ෂිතභාවය තහවුරු කිරීම. උ. ස්වභාවික ව්‍යවසනයන් සිදුවූ අවස්ථාවේදී ජීවිත ගලවා ගැනීමේ මෙහෙයුම් සඳහා සහභාගී වීම, ආරක්ෂා කිරීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සහ එකී ව්‍යවසන සහ මුහුදේ සිදුවන වෙනත් හාණ්ඩ සම්බන්ධයෙන් වූ යාත්‍රා මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම. ඌ. සමුද්‍රිය සහ සමුද්‍රාසන්න පරිසර සංරක්ෂණ සහ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම. එ. සමුද්‍රිය දූෂණ ඇතුළු මුහුදේදී සිදුවන වෙනත් ව්‍යසන වැළැක්වීම පාලනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ නියාමනය කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දීම. ඒ. සමුද්‍රිය සත්ව සහ ශාක විශේෂ සංරක්ෂණය කිරීම. ඔ. ස්වභාවික ව්‍යසන අවස්ථාවලදී විදුලිය හෝ වෙනත් ක්‍රම මඟින් අනතුරු ඇඟවීම ඇතුළු තොරතුරු ව්‍යාප්ත කිරීම. ඕ. ශ්‍රී ලංකාවට නීති විරෝධී සංක්‍රමිකයන් ආගමනිකයන් ඇතුළුවීම සහ විගමනිකයන් පිටවීම වැළැක්වීම සහ මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය ජාවාරම් කිරීම වැළැක්වීම තහනම් බඩු හා අවි ආයුධ සොයා ගැනීම හා අත්අඩංගුවට ගැනීම. ක. නීති විරෝධී වාර්ථා නොවන අවිධිමත් ධීවර කටයුතු පිළිබඳ විමර්ශනය කිරීම සහ වැළැක්වීම. ග. ශ්‍රී ලංකාවේ මුහුදු තීරයට විජාතික ධීවර යාත්‍රා අනවසරයෙන් ඇතුළුවීම නීති විරෝධී ධීවර කටයුතුවල නිරතවීම වැළැක්වීම අත්අඩංගුවට ගැනීම සහ නීතිය ඉදිරියට පැමිණ වීමට කටයුතු කිරීම. ච. මුහුදේදී ආපදාවට ලක්වන නෞකා යාත්‍රාවන්ට සහ එම නෞකා යාත්‍රාවන් සිට සොයාගනු ලබන තැනැත්තන් සඳහා සහය ලබාදීම. ජ. මුහුදේදී හෝ අභ්‍යන්තර ජල තීරයෙහි සිදුවිය හැකි තෙල් කාන්දුවීම පැතිරවීමේ වැළැක්වීම සහ පාලනය මඟින් සිදුවිය හැකි පරිසර හානිය වැළැක්වීම. ට. රජය විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත කාලානුරූපිව ලබාදෙන හෝ පවරන අනෙකුත් කාර්යය භාර්යාන් ඉටු කිරීම .
2. හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය	මෙම දෙපාර්තමේන්තුවට අදාළ වෙන්වූ තිරසාර අරමුණු හුදෙක් සමුද්‍රීය පරිසරයේ ආරක්ෂාව තහවුරුකර මෙරට මුහුදු තීරයෙහි

මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	නීතීය බලාත්මක කිරීම ආදී ජාතික ආරක්ෂාව සමඟ බැඳි අතර, කරුණු බැවින්ද ඒ ඒ සිදුවීම අනුව ක්‍රියාකළයුතු ආකාරයන් එකිනෙකට වෙනස්වන අතර, සෘජුවම ඉලක්කයන් තීරණය කිරීම ප්‍රායෝගික නොවන කරුණකි. උදා: 2025 වන විට සමුද්‍රීය ආපදාවන් 60% කින් මැඩ පැවැත්වීම 2030 වන විට මුහුදේ සිදුවන මත්ද්‍රව්‍ය ජාවාරම් සහමුලින්ම නවතා දැමීම ආදී වශයෙන්.
3. හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	ඉහත විමසුම් දෙකට අනුව පැහැදිලි ඉලක්ක තීරණය කල නොහැකි බැවින් ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කිරීමද ප්‍රායෝගික නොවෙති. නමුත් ඒ ඒ සිදුවීම් වලට අදාළව එම සිදුවීම අවසන් වන තෙක්ම මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු විය යුතු සියළුම කටයුතු ප්‍රමාදයකින් තොරව නිවැරදිව සහ කඩිනම්ව ඉටු කිරීට මෙම දෙපාර්තමේනුතුව සෑම අවස්ථාවකදීම කටයුතු කර ඇත.
4. 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස්කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබීම.	ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රාජකාරි නියතු වෙරළ ආරක්ෂක පුද්ගලයින් රාජකාරීමය අවශ්‍යතාවය අනුව ද්විතීයික පදනම මත ශ්‍රී ලංකා නාවික හමුදාව මඟින් කාලාණුරූපීව අනුයුක්ත කිරීම/ මාරු කිරීම සිදුකරනු ලබයි. එබැවින් 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව මානව සම්පත් කලමනාකරණ සැලැස්මක් පූර්ණ වශයෙන් පවත්වාගෙන යාම ප්‍රායෝගික නොවේ.
5. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවන් සහතික කර නොතිබුණි.	2021 වසර තුල ශ්‍රී ලංකාව පුරා විවිධ අවස්ථාවන්හි දී විවිධ ස්ථාන වලින් කොවිඩ් - 19 ආසාධිත පුද්ගලයින් වාර්ථා වූ අතර, එම අවස්ථාවන්හීදී වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ පුද්ගලයින්ද නිරෝධායනය සඳහා යොමු කිරීමට සිදුවිය. මේ හේතුවෙන් සහ රටතුල පනවා තිබූ විවිධ සමාජ දුරස්ථභාවයන් හේතුවෙන් පාඨමාලා සැලසුම් කිරීමේදී හැකිතාක් කණ්ඩායම් වශයෙන් සිදුකරනු ලබන පුහුණුවන් සීමාකර එම වසරේ වාර්ෂික පුහුණු කාල සටහන සකස් කර ඇති බැවින් කාර්ය මණ්ඩලයේ 50% කට අවම වශයෙන් පැය 12 ක තරම් වූ පුහුණුවක් සැලසුම් කිරීම අපහසු වී ඇති බව පෙනී යයි. තවද, එසේ සැලසුම් කල පාඨමාලා/පුහුණු කටයුතු ද කණ්ඩායමක් ලෙසින් සිදු කිරීම සහ පවත්වාගෙන යාම ඉතා අපහසු වී ඇති බැවින් 2021 වර්ෂයේදී සැලසුම් කල පුහුණුවන් පවත්වාගෙන යාමේදී එහි ප්‍රතිශතය 50 % ට වඩා අඩු මට්ටමක පැවතී ඇති බව නිරීක්ෂණය වේ.

6. සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි	දැනට ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රාජකාරි කරනු ලබන නිලධාරීන් සහ නාවිකයින් සියළු දෙනා නාවික හමුදාව වෙතින් ද්වීතික පදනම මත අනුයුක්ත වී ඇති බැවින් ඔවුන්ගේ සේවා ඵල ඇගයීම්/ පුහුණුවීම් හා උසස්වීම් ලබාදීමේදී අනුක්‍රමික පිළිවෙල සැකසීමට/ සේවා සඳහා ගිවිසුම්ගතවීම යන කරුණු නාවික හමුදාවේ අනුගමනය කරනු ලබන ක්‍රමවේදයට අනුගතව සිදු කරනු ලබයි. එම ක්‍රමවේදය තුල නාවිකයින්ගේ වාර්ෂික හා අර්ධවාර්ෂික වශයෙන් සේවා ඵල / කාර්ය සාදනය ඇගයීමට ලක්කරනු ලබන අතර, සියළු නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයීම් වසරකට වරක් හෝ සේවා සථානය මාරු වීමකදී ඔහුගේ වාර්තා කරනු ලබන නිලධාරියා වෙනස්වීමකදී සිදුකරනු ලබයි.
7. මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	මානව සම්පත් සම්බන්ධ රාජකාරී සඳහා අධ්‍යක්ෂ (පුද්ගල හා පරිපාලන) තනතුරෙහි රාජකාරි කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරි සහ නිපුණතා සංවර්ධන හා පුහුණු රාජකාරීන් සඳහා අධ්‍යක්ෂ (පුහුණු) යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රීලංවෙආදෙ මඟින් රාජකාරීන් වෙන්කර බෙදා දැක්වීමේ සංදේශය මඟින් පත්කර ඇති අතර, මානව සම්පත් කළමනාකරණය සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් අධ්‍යක්ෂ (පුද්ගල හා පරිපාලන) කපිතාන් (මාලිමා) පීඑස් පරණවිතාන එන්ආර්එක්ස් 1295 දරන ජ්‍යෙෂ්ඨ නිලධාරියා මඟින් සිදු කෙරේ.
8. සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	කොවිඩ් - 19 වසංගත තත්ත්වය නිසා රට තුල පනවා තිබූ නීති රෙගුලාසි ක්‍රමයෙන් ලිහිල් වීමත් සමඟ මෙම දෙපාර්තමේන්තුව විසින් නැවතත් පුහුණු කටයුතු 2018/02 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයේ 6.1 වගන්තිය අනුව විධිමත් කර ඇති අතර, 2022 වර්ෂයේ දී මෙම දෙපාර්තමේන්තුවට අයත් පුද්ගලයින් 921 දෙනෙකු සඳහා විවිධ දේශීය සහ විදේශීය පුහුණු පාඨමාලා අවස්ථා ලබා දී ඇත. එය ආසන්න වශයෙන් ප්‍රතිශතයක් ලෙස සමස්ථ කාර්යය මණ්ඩලයෙන් 67% ක ප්‍රමාණයකි. තවද, 2023 වර්ෂයේ මෙම පුහුණුවීම් සඳහා වෙරළ ආරක්ෂක දෙපාර්තුමේන්තුවේ පුද්ගලයින් 1137 දෙනෙකු සඳහා අවස්ථාව ලබා දී ඇති අතර, එය සමස්ත කාර්යය මණ්ඩලයෙන් ආසන්න වශයෙන් 82% ක ප්‍රතිශතයකි. තවද, 2024 වර්ෂයේ වාර්ෂික පුහුණු සැලසුම සකස් කිරීමේදී ද මෙරට පුහුණු සඳහා පමණක් සමස්ත කාර්යය

	මණ්ඩලයේ 70% ට වඩා වැඩි ප්‍රතිශතයක් සඳහා පුහුණුව ලබාදීම සඳහා සැලසුම් කර ඇත. මෙම ප්‍රමාණය විවිධ අවස්ථාවන්හි දී මෙම ආයතනය වෙත ලැබෙන විවිධ විදේශ පුහුණුවන් සමග තවත් ඉහල අගයක් ගන්නා බව පෙනී යයි.
9. ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ අභිතකර මට්ටමේ විය.	අග්‍රිම ගිණුම පිසියෙල කිරීමේදි අග්‍රිම සාරාංශය (SA/70) හි සඳහන් ශේෂයන් සැලකිල්ලට නොගැනීමත්, පැවති කොවිඩ්-19 වසංගත තත්ත්වය පදනම්ව නව අවශ්‍යතාවයන් උත්පාදනය වීම හේතුවෙන් 2021 වර්ෂය සඳහා කරන ලද පුරෝකථනයන් සහ අනුමත ඇස්තමේන්තුවෙන් එම ආකාරයෙන්ම යොදා ගැනීමට නොහැකි වීමත්, බිල්පත් නිරවුල් කිරීමේදි පුනරාවර්තන ස්වභාවයේ වියදම් සහ මූලධන වියදම් නිවැරදිව හඳුනා නොගැනීමත්, ගිණුම් තැබීමේ දෝෂ සහ බැරකම් නිසි පරිදි වාර්තා කිරීමට අපොහොසත්වීම යන කාරණා විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ අභිතකර මට්ටමේ නිරීක්ෂණයන්ට හේතු පාදකවූ අතර, මෙවැනි නිරීක්ෂණයන් ඉදිරියේදී ඇති නොවීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව වැඩි දුරටත් දන්වා සිටිමි.

වී.කේ.එච්. කෝලිත
ප්‍රධාන මූල්‍ය නිලධාරි
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ

7. කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු / කමිටුව විසින් ලබාදෙන ලද මාර්ගෝපදේෂ	අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ආයතනය ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
පළමු කොටස	
1. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	මේ වන විට විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන සෑම විගණන විමසුමක් සඳහාම මසක් ඇතුළත පිළිතුරු සපයා ඇත.
2. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	මේ වන විට සියලු අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් ඇතුළත පිළිතුරු සපයා ඇත.
3. මූ.රෙ. 134 (3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂයේදී මෙම අංශයේ අභ්‍යන්තර විගණක තනතුර සඳහා ස්ථීර නිලධාරියෙකු පත්කර නොමැති අතර" වැඩ බැලීම සඳහා නිලධාරියෙකු පත්කර සිට ඇත. 2022 වර්ෂය තුල අභ්‍යන්තර විගණන වාර්තා දෙකක් පමණක් ඉදිරිපත් කර ඇති අතර, එහි පිටපත් විගණකාධිපති වෙත යොමු කිරීමට මහහැරී ඇත. නමුත් මේ වන විට නිසි පරිදි අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කරන බව දන්වා සිටිමි.
4. 2017.06.26 දිනැති අංක 1/2017 දරන වතකම් කළමනාකරණ චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත්කර කොමිසාරිස් ජනරාල් කාර්යාලය වෙත දන්වා නොතිබුණි.	2023.11.16 දිනැතිව වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ විධිවිධාන සම්බන්ධීකරණයට නිලධාරියෙකු පත්කර කොමිසාරිස් ජනරල් කාර්යාලය වෙත දන්වා ඇත.
5. 2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මූ.රෙ.756(6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂයේ පැවති ඉන්ධන හිඟය හේතුවෙන් බාහිර කාර්යාලවල භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිසි වේලාවට කළ නොහැකි වූ අතර, මේ වන විට අවසන් කර ඇත.
6. සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	මේ වන විට සියළුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත.

7. වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	ණය නොගෙවීම සම්බන්ධයෙන් මෙම නිලධාරියාට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා 2024.02.09 දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලිපිගොනු යවා ඇත.
8. කාර්ය මණ්ඩලයේ සියළු දෙනා වෙත ලිඛිත කාර්ය පැවරුම් කර නොතිබුණි.	මේ වන විට ලිඛිත රාජකාරී පැවරීම් සිදු කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත
දෙවන කොටස	
1. ආයතනයේ පුරවැසි /සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	මේ වන විට පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය අධීක්ෂණය කිරීමට / ඇගයීමට ක්‍රමවේදයක් සකස් කර ඇත.
2. 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	අදාළ ආකෘතිය අනුව 2022 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර නොතිබූ අතර, දෙපාර්තමේන්තුවේ දීර්ඝකාලීනව සිදුකරගෙන යන ක්‍රමවේදය තුල මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පැවති අතර, ඒ අනුව කාර්ය මණ්ඩලය සඳහා පුහුණු අවස්ථා ලබා දීම සිදු කෙරිණි. නමුත් මේ වන විට 2024 වර්ෂය සඳහා 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කර ඇත.
4. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	2024 වසර සඳහා වන මානව සම්පත් සැලැස්ම 2024-05-17 දින අනුමත වූ අතර, ඒ අනුව දැනට දෙපාර්තමේන්තුවේ සිටින කාර්ය මණ්ඩලය 347 වන අතර ඒ අතුරින් 249 දෙනෙකු සඳහා පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථා සැලසුම් කර ඇත.
5. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවසථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2024 මානව සම්පත් සැලැස්ම අනුව සියලු නිලධාරීන් කණ්ඩායම් සඳහා ධාරිතා සංවර්ධන සහ පුහුණු කටයුතු විධිමත් ආකාරයට සැලසුම් සහගතව 2024 සඳහා කටයුතු සිදු කරමින් පවතී.

6. ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	මෙම තත්ත්වය මහඟැර ගැනීමට මේ වන විට පියවර ගෙන ඇත.
7. සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	2023 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.
8. මු.රෙ.119 ප්‍රකාරව අය කළ යුතු අධිභාර අයකර නොතිබුණි.	සිදුවී ඇති අලාභහානි සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු පරීක්ෂණ වලින් ඉදිරියට ගිය විමර්ශන කටයුතු සඳහා පොලිස් දෙපාර්තමේන්තුව හා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසන් සභාව වෙත අදාළ තොරතුරු යොමු කර ඇති අතර, මේ වන විට එම විමර්ශන කටයුතු අවසන් කර ඇත. ඒ අනුව මේ සම්බන්ධ වගකිව යුතු පාර්ශවයන් අනාවරණය වී නොමැති බැවින් මු.රෙ. 119 යටතේ අධිභාර අයකර ගැනීමක් සිදුවී නැත.

ඩී.කේ.එච්. කෝලිත
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ